## වඩා හොඳ සාම මෙවලම - විචාරක ඇසින්

"මෙම මෙලම ඉතා ප්‍රයෝජනවත් එකකි. එය වසර ගණනාවක් පැවති අවශ්‍යතාවයකි. "

- සිසිලියා එල්වර්ති, සාම ක්‍රියාධරනී හා ඔක්ස්ෆර්ඩ් පර්යේෂණ කණ්ඩායමේ නිර්මාතෘ

" මෙය ඉතාමත් වැදගත් වාර්තාවකි.... බොහෝ දුරට අද වනතෙක් ලියන ලද හොඳම වාර්තාවක් බව කිව හැකිය. "

- කැරේ ආස්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නෝර්විජියානු තානාපතිවරයා

" ප්‍රායෝගික පර්යේෂණ හා ප්‍රඥාවෙන් බොහෝ දුරට ප්‍රයෝජනය ලබාගෙන ඇති ඉතා අනර්ඝ නිර්මාණයකි. "

- යූසුෆ් මහමූද්, ජාත්‍යන්තර සාම ආයතනයේ ජේෂ්ඨ උපදේශක

" ඉතා හොඳ සාම මෙවලම කැපී පෙනෙන නිර්මාණයකි.... එහි වටිනා තොරතුරු සම්භාරයක් ඇතුළත් වී තිබෙන අතර, ක්‍රියාධරයන් පහසුවෙන් ප්‍රයෝජනයට ගත හැකි මාර්ගෝපදේශකයක් වේ. එය පුළුල් සාක්ෂි පදනම් කරගත්, මෙම මාතෘකාවට අයත සියලුම කරුණු ඇතුළත් නිර්මාණයක් වේ. "

- තානාපති දොන් ස්ටීන්බර්ග්, world learning ආයතනයේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි, එක්සත් ජනපදය සඳහා වූ හිටපු අන්ගෝලා තානාපතිවරයා

## අපට ඉතා හොඳ සාම මෙවලම අවශ්‍ය වන්නේ ඇයි?

" සාම ක්‍රියාවලියකින් සිවිල් සමාජ ක්‍රියාධරයන් හා කාන්තාවන් ඉවත් කිරීමේ අවදානමක් තිබේ නම්, සාම ක්‍රියාවලියක් තිබිය නොහැකිය. "

- සෙනෙට් සභික මොබීනා ජාෆර්, කැනේඩියානු සෙනෙට් සභික හා සූඩානය සඳහා වූ හිටපු කැනඩාවේ තානාපතිවරයා

" අප සාමය ඇති කරන්නේ කෙසේදැයි යන කාරණය පිළිබඳ ප්‍රශ්න කළ යුතුව ඇත. සටන් අවසන් කිරීම සඳහා සිදුකරන සාකච්ඡා, සාමය ඇති කිරීම සඳහා සිදුකරන සාකච්ඡාවට ඒ ආකාරයෙන්ම සමාන නොවේ".

- රෝසා එමලියා සලාමන්කා, CIASE විධායක අධ්‍යක්ෂකවරිය, කොළොම්බියා


ICAN ජාත්‍යන්තර සිවිල් සමාජ ක්‍රියාකාරී ජාලය

කාන්තා අයිතීන් සාමය හා ආරක්ෂාව සඳහා ජාත්‍යන්තර සිවිල් සමාජ ක්‍රියාකාරී ජාලය (ICAN)

1779 Massachusetts Ave, NW Suite 710
Washington DC 20036 USA
www.icanpeacework.org


# වඩා හොඳ සාම මෙවලම


පළමු මුද්‍රණය 2015


සමථකරණය, ගැටුම් වැළැක්වීම හා සාමය ඇති කිරීම යන ක්‍රියාවලීන්වල සාමය ගොඩනගන කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ දෘෂ්ඨිකෝණයන් ඉතා සාර්ථක ලෙස ඇතුළත් කරගැනීම සඳහා ප්‍රායෝගික පියවරයන් ඉදිරිපත් කරන,

විවිධ පසුබිම්වලට ගැලපෙන ආකාරයෙන් යොදා ගත හැකි, විවෘත අත්පොතක් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාව 1325 න්‍යාය පත්‍රය සර්ව සම්පූර්ණයෙන් යතාර්ථයක් කර ගැනීමට අත දීම සඳහා පිළියෙල කර ඇත.

ජාත්‍යන්තර සිවිල් සමාජ ක්‍රියාකාරී ජාලය

# අපගේ ස්තුතිය

මෙහි අත්පිටපත කියවා ප්‍රයෝජනවත් සමාලෝචනයක් ඉදිරිපත් කළ පහත සඳහන් පුද්ගලයන්ට අපගේ ස්තුතිය පුද කරමු. තානාපති කැරේ ආස් ඩැනියල් ටොරස් මයා, ආචාර්ය සිල්ලා එල්වර්ති, රැචෙල් ගැසර් මිය, මෙලින්ඩා හෝමර්ස් මිය, සෙනට් සභික මොබීනා ජාෆර්, ආචාර්ය කැත්ලින් කියුනාස්ට්, යූසුෆ් මහ්මුඩ් මයා, ආචාර්ය ජොයිස් දුනූ මහාචාර්ය ජෝන් පැකර්, අන්ටෝනිය පොටර්-ප්‍රන්ටිස්, ආචාර්ය ගේ රොසන්බ්ලම් කුමාර්, ජොසිලින් ෂූමේකර් මිය, මරීටා සෝර්හයිම්, රෙන්ස්වික්, තානාපති ඩොන්ල්ඩ් ස්ටීන්බර්ග්, ට්‍රුල්ජා ටර්විට් හා කැලම් වට්සන් මහතා.

ඊට අමතරව මෙම ප්‍රකාශනයේ සැකසුමට හා අන්තර්ගතයට විවිධ ආකාරයෙන් සහයෝගය ලබාදී, සාකච්ඡාවලට සහභාගී වූ පහත සඳහන් අයට අපගේ ස්තුතිය පළ කර සිටිමු. රීනා අමීර් මිය, ආචාර්ය වර්ජිනියා බෝවියර්, කේට් බුචානන් මිය, මාවික් කබ්රේරා බෙලිසා මිය, රොබට් ඩාන් මහතා, තානාපති

රිවෝල්ඩ් පී රෙඩ්ඩා, ඩැනියල් ගෝල්ඩ්බර්ග් මිය, අමල් ගෝරානි මිය, ස්ටීවන් ජැක්සන් මහතා, ලෝන් ජේසන් මිය, සයිමන් මේසන් මහතා, සකුන්තලා කදිර්කාමර් මිය, කරිත් රෙයාන් මිය, එලිසබෙත් ෂිපර් මිය, ඩේවි සුරලගා මිය, සාත් ටිල්මන්ස් මිය, ගීනා ටෝරි මිය, නහ්ලා වල්ජි මිය හා ටෙරේසා විට්ෆීල්ඩ් මිය.

''වඩා හොඳ සාම මෙවලම'' (The Better peace Tool) නිල වශයෙන් පිළිගැනීමට ලක් කළ කාර්ටර් මධ්‍යස්ථානයට හා (උගන්ඩා) 1325 පිළිබඳ ක්‍රියාකාරී සන්ධානයට අපගේ හෘදයාංගම ස්තුතිය මෙයින් පුද කරමු. අපට අඛණ්ඩව සහයෝගය ලබාදෙන පහත සඳහන් සංවිධානවලට ද අපගේ කෘතඥතාවය පළ කර සිටිමු. Cordaid සංවර්ධන සහයෝගිතාවය සඳහා වූ නෝර්වීජියානු නියෝජිතායතනය (NORA)" රාජකීය විදේශ කටයුතු අමාත්‍යාංශය, ස්විස් ෆෙඩරල් විදේශ කටයුතු අමාත්‍යාංශය හා UN Women සංවිධානය.

## වඩා හොඳ සාම මෙවලම

සාමය සඳහා වූ වඩා හොඳ මුල පිරීම, (The better Peace Initiative) යන වැඩ සටහන 2014 වසරේදී ජාත්‍යන්තර සිවිල් සමාජ ක්‍රියාකාරී ජාලය (ICAN) විසින් ආරම්භ කරන ලදී. සාමය ඇති කිරීමේ හා සමථකරණ ක්‍රියාවලීන්වල සාමය ගොඩනැගීමේ කාර්යයේ යෙදී සිටින කාන්තාවන් ඇතුළත් කර ගැනීම සඳහා ප්‍රායෝගික මග පෙන්වීමක් ලෙස එය සංවර්ධනය කරන ලදි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ පර්යේෂණ රැස්වීම් හා බහුවිධ සාකච්ඡා හරහා කාන්තාවන් ඇතුළත් කර ගත යුත්තේ ඇයි යන ප්‍රශ්නයෙන් ඔබ්බට ගොස් ප්‍රායෝගිකව එය සිදු කළ යුත්තේ කෙසේද යන ප්‍රශ්නය මතු කිරීම වේ. කාන්තාවන් ඇතුළත් කරගැනීමට දිගටම පවතින බාධකයන් හඳුනා ගැනීම හා ඒවා ජය ගැනීම සඳහා සාර්ථක උපාය මාර්ග යෙදීම මගින් මෙය සිදු කරනු ලැබේ.

"වඩා හොඳ සාම මෙවලම" හා ඊට අදාළ සම්පත් පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා www.better peace tool .org වෙබ් අඩවියට පිවිසෙන්න. සමාජ මාධ්‍ය ඔස්සේ # betterpeace බලන්න

## ව්‍යාපෘති කණ්ඩායම

ICAN සම-නිර්මාතෘ හා විධායක අධ්‍යක්ෂිකා වන සනම් නරාගි - අන්ඩරිලිනි මහත්මියගේ මූලිකත්වයෙන් මෙම ව්‍යාපෘතිය මෙහෙයවන ලදී. වැඩසටහන් නිලධාරී ස්ටීපනී බ්‍රිට්ස්මන්, හිටපු වැඩසටහන් නිලධාරී මැඩලින් කෝච් හා ශ්‍රේෂ්ඨ පර්යේෂක ඇන්ඩ්‍රි සුලේබාන් යන අය ව්‍යාපෘති කළමනාකරණය, පර්යේෂණ හා කෙටුම්පත් පිළියෙල කිරීම යන කාර්යයන්හි සහයෝගය ලබාදුන් අතර, DHM Media සමූහ ආයතනයේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී රීගන් ස්මිත් මහතා විසින් මාධ්‍ය සැකසුම සිදු කරන ලදී.

# පටුන

විධායක සාරාංශය 1

I. කොටස I

21 වැනි සියවසේ රාජ්‍යතන්ත්‍රික කලාව 2

- විකාශනය වන කලාව
- කාන්තාවන් සඳහා වෙනස්වන ඉලක්කයන්
- සාම ක්‍රියාවලීන් සියලු දෙනා ඇතුළත් කර ගන්නා ක්‍රියාවලීන් වශයෙන් ක්‍රියාත්මක කරන්නේ, කෙසේද, යන ප්‍රශ්නය ආමන්ත්‍රණය කිරීම

කොටස II

වඩා හොඳ සාම මෙවලම 10

සියලු දෙනා ඇතුළත් කර ගන්නා සාම ක්‍රියාවලීන් හා සාකච්ඡා සඳහා මඟ පෙන්වීමක්

කොටස I 11

පොදු බාධක හා නවෝත්පාදන විසඳුම්, සියලු දෙනා ඇතුළත් කර ගන්නා සාම ක්‍රියාවලිය සඳහා වූ නව පූර්වාදර්ශයන්

- සමාජ පරිවර්තන වශයෙන් සිදුවන සාම ක්‍රියාවලීන්
- පොදු බාධක හය හා ඒවා ජය ගන්නේ කෙසේද ?

1 " අප සියලු දෙනාම නියෝජනය කරන්නෙමු"

2 "සමථකරුවාට සියලු දේ කළ නොහැකිය"

3 "කොහොම වුනත්, කවුද මේ කාන්තාවන් ? "

4 " මෙය කාන්තාවන්ට අදාළ දෙයක් නොවේ "

5 "මගේ හැකියාව හා දක්ෂතා පදනම් කරගෙන මා මෙතැන සිටිමි "

6 " කාන්තාවන් බැහැර කිරිම සංස්කෘතික වශයෙන් සිදුවන දෙයකි."

## කොටස 2

17

වඩා හොඳ සාමයක් සඳහා මඟ පෙන්වන ක්ෂේත්‍ර හතරක්, සියලු දෙනා ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවරයන්

- සමථකරණ පසුබිම අවබෝධ කරගැනීම
- සියලු දෙනා ඇතුළත් කරගැනීමට දේශපාලන සහයෝගය ලබාදීම
- තාක්ෂණික සහයෝගය ලබාදීම
- පොදු පහසුකම් හා මූලාධාර ලබාදීම

## නිමාව

# වෙනස්වන පරිචයන් හා රටාවන්

**කොටු කොටුව 1:** එකතු කළ අගයන්
සාම සාකච්ඡාවලදී සිවිල් සමාජය

**කොටුව 2:** කාන්තාවන් වන අප කියන්නේ මොනවාද:
සහභාගිත්වය හා ආරක්ෂක මණ්ඩල යෝජනාව 1325

**කොටුව 3:** නියැඳි නිර්ණායකය: සමථකරණයේ ඇතුළත් කරගැනීම සඳහා සිවිල් සමාජය හඳුනාගැනීම 14

**කොටුව 4:** සිවිල් සමාජ නියෝජිතයන් තෝරා ගැනීම සඳහා යහපත් පරිචයන් 19

## ඇමුණුම්

### ඇමුණුම් I

කාන්තාවන් සාමය හා ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවන්

# විධායක සාරාංශය

සමකාලීන ලෝකයේ සිදුවන යුද්ධවල පාර්ශ්වකරුවන් විශාල ප්‍රමාණයක් සිටින අතර, ඒවා සංකීර්ණතාවයෙන්ද බහුලවීම නිසා එම යුද්ධයන් වළක්වා ගැනීමටත්, ඒවාට විසඳුම් ලබා ගැනීමටත් නව ප්‍රවේශයන් අවශ්‍ය වේ. සාමය ස්ථාපිත කිරීමේ දී රාජ්‍ය හා රාජ්‍ය නොවන සන්නද්ධ පාර්ශ්වකරුවන් ඇතුළත් කරගත යුතුය. නමුත් අපගේ අරමුණ තිරසාර සාමයක් ස්ථාපිත කිරීම නම් එයට මේවා පමණක් ප්‍රමාණවත් නොවේ

ඉතා දැඩි ප්‍රචණ්ඩ තත්ත්වයන් තුළ වුවද සිවිල් සමාජයේ කොටසක්-බොහෝ අවස්ථාවල කාන්තාවන්-තම රටේ සාමය නැවත ගොඩනැගීම සඳහා නිර්භීතව හඬ නැගීමටත්, අරගල කිරීමටත් ඉදිරිපත් වෙති. තමන්ගේ අගයන් හා විශ්වාසයන් සන්නද්ධව ඔවුන් එසේ කරති. මෙම තත්ත්වයන්ගෙන් මිදීම සඳහා ඔවුන් සතුව උපාය මාර්ගයක් නොතිබුණත්, සමාජ සාධාරණත්වය හා සමානාත්මතාවය පදනම් කරගත් සමාජය පිළිබඳ දැක්මක් ඔවුන් සතුව තිබේ. එම කාන්තාවන් යුධ කලාපයක ජීවිතය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබාගෙන සිටින අතර. බිම් මට්ටමේ යථාර්ථයන් පිළිබඳ

දැනුමකින්ද සන්නද්ධ වී සිටිති. ආරක්ෂාවට තිබෙන තර්ජන පිළිබඳවද, තත්ත්වය දරුණු අතට හැරීම වළක්වා ගැනීමට අවශ්‍ය සාර්ථක පියවරයන් හා සාමය නැවත ස්ථාපිත කිරීම යන කරුණු පිළිබඳව ද මෙම කාන්තාවන් දැන සිටිති. ඔවුන් ලබාදී ඇති දායකත්වයන් හා සාමය ගොනැගීමේ ක්‍රියාවලියේ දී කාන්තාවන්ට ඉටුකළ හැකි වැදගත් කාර්යභාරය පර්යේෂණ නිගමනයන් තහවුරු කර ඇත.

සාම සාකච්ඡා ආරක්ෂක හා දේශපාලන ක්‍රියාවලීන්ගෙන් සමන්විත දෙයක් බවට පටු මතයක් පවතී. එයින් ඔබ්බට ගොස් සියලු දෙනා ඇතුළත් කරගන්නා ක්‍රියාවලීන් වශයෙන් එම සාකච්ඡා පිළිගැනීමට ලක්වන ආකාරයෙන් විශාල වෙනසක් ඇතිවිය යුතුය. භාවිතයන් වෙනස් කර ගැනීමද එයට අවශ්‍ය වේ.

''වඩා හොඳ සාම මෙවලමක්'' යන මෙම ප්‍රකාශනය, සාම ක්‍රියාවලීන්වල ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පිළිබඳ දෘෂ්ඨි කෝණයන් හා සාමය ගොඩනැගීමේ යෙදී සිටින කාන්තාවන් සාර්ථකව ඇතුළත් කරගැනීමට අවශ්‍ය ප්‍රායෝගික මඟපෙන්වීමක් ලබාදීම මඟින් (සියලු දෙනාදෙනා ඇතුළත් කර ගන්නේ) ''කෙසේද?

යන ප්‍රශ්නය ආමන්ත්‍රණය කරයි. මෙහි කොටස I නූතන යුගයේ සාමය ස්ථාපිත කිරීමේ ඉතිහාසය හා ක්‍රම ක්‍රමයෙන් එය වර්ධනය වූ ආකාරය විස්තර කරයි. කොටස II වඩා හොඳ සාම මෙවලම කොටස් දෙකකින් ඉදිරිපත් කරයි. අංශය I සාමය ගොඩනැගීමේ කාර්යයේ යෙදී සිටින කාන්තාවන් මෙම ක්‍රියාවලියට ඇතුළත් කරගැනීම වළක්වන පොදු බාධක හයක් ආමන්ත්‍රණය කරයි. දෙවෙනි අංශය කොටස් හතරකින් සමන්විත සම්පූර්ණ රාමුවක් ඉදිරිපත් කරයි. එය මෙයට අවශ්‍ය සංකල්පමය පරිවර්තන සමග දේශපාලනික, තාක්ෂණික හා පොදු පහසුකම්/මූල්‍ය අවශ්‍යතාවයන් කෙරෙහි අවධානය යොමු කරයි.



## ‘‘සාමය ගොඩනගන කාන්තාවන්’’ කවුද?

‘‘සාමය ගොඩනඟන කාන්තාවන්’’ යන වචනය අවිහිංසාවාදයට කැපවී සිටින තනි පුද්ගලයන් හා කාන්තා මූලික සංවිධාන සඳහා යෙදෙන වචනයකි. ඔවුන් සාම සාකච්ඡාවලට පක්ෂව සිටින අතර, මානව හිමිකම් හා කාන්තා අයිතිවාසිකම් වලට සහයෝගය දක්වති. සමහර අය යුක්තිය වෙනුවෙන් හඬ නඟති. සෙසු අය ගැටුමේ බලපෑම් ආමන්ත්‍රණය කිරීමට හා/හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාව දෘෂ්ඨි කෝණයකින් සාමය ප්‍රවර්ධනය කිරීමට වැඩ කරතිත ගැටුමක් සාකච්ඡා මගින් විසඳා ගතයුතු බවට පළමුවෙන් හඬ නඟන පුද්ගලයන් ඔවුන් වුවත්, තවමත් ඔවුන් කොන් කිරීමට ලක්වී සිටිති. (බලන්නා: කොටුව 3 - සිවිල් සමාජය හඳුනා ගැනීම සඳහා නියැඳි නිර්ණායකය).

# කොටස I
# 21 වැනි සියවසේ රාජ්‍ය තන්ත්‍රික කලාව බලය බෙදා ගැනීමේ සිට වගකීම් බෙදා ගැනීම දක්වා

සනම් නරාගි අන්ඩර්ලිනි

ඉතිහාසය පුරාවටම යුද්ධය හා සාමය පිළිබඳ සාම සාකච්ඡා වැඩි වශයෙන් ඉහළ පෙළේ දේශපාලන හා හමුදා නායකයන් සම්බන්ධ වන ක්‍රියාවලීන් ලෙස සිදුවී තිබේ. කෙසේ වෙතත්, පසුගිය දශකවල යුද්ධය හා සාමය ගොඩනැගීම යන කටයුතුවල සැලකිය යුතු වෙනස් වීම් ඇති වී තිබේ. පසුගිය දශකයේ දී යුද්ධවල සමස්ථ සංඛ්‍යාව - විශේෂයෙන් රාජ්‍යයන් අතර සිදුවූ යුද්ධවල සංඛ්‍යාව - පහත වැටී ඇති නමුත්, අපට දක්නට තිබෙන ගැටුම් ඉතා සංකීර්ණ ඒවා වේ. සීතල යුද්ධයේ අවසානය, රාජ්‍යයන් අතර සිදුවන යුද්ධ වැඩිවීමටත්, ජාතික මායිම්වලින් ඔබ්බට යන ගැටුම් නිර්මාණය වන තත්ත්වයන් බහුල වශයෙන් නිර්මාණය වීමටත් මඟ පාදා ඇත.

යුද්ධයකට සම්බන්ධවන පාර්ශ්වයන්ගේ සංඛ්‍යාවෙ සීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබේ. මෙම

පාර්ශ්වයන් ජාත්‍යන්තර හා ජාතික ආරක්ෂක හමුදාවන්, තමන් වෙනුවෙන් වෙන අය ඉදිරියට යවන කලාපීය බලවේගයන්, රාජ්‍ය නොවන දේශීය සන්නද්ධ කණ්ඩායම් හා එක රටක සේවයේ යෙදවීම සඳහා වෙනත් රටකින් පුද්ගලයන් බඳවා ගන්නා දේශ සීමාවන්ගෙන් තොරව ක්‍රියාත්මක වන සන්නද්ධ කණ්ඩායම් යනාදී කණ්ඩායම් වලින් සමන්විත වේ. එම තත්ත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇත්ත වශයෙන්ම ප්‍රචණ්ඩත්වය, ප්‍රජාතන්ත්‍රීකරණය, හෝ විවිධාංගීකරණය. වී තිබේ. බොහෝ අය බිම් මට්ටමේ ජීවත්වන ප්‍රජාවන් සමඟ කිසිම සම්බන්ධයකින් තොරව තමන්ගේම දැක්ම හා න්‍යාය පත්‍රය ලුහුබැඳ යති. තවත් සමහර පාර්ශ්වයන් තමන්ගේම අරමුදල්වලින් යැපෙන අර්ධ සාපරාධි කණ්ඩායම් වේ. ඔවුන් මත්ද්‍රව්‍ය වෙළඳාම, අවි ගනුදෙනු, මිනිස් ජාවාරම් යන මාර්ග හරහා මුදල් උපයති. එසේ නැත්නම් අනෙකුත් ලාභදායී සම්පත් ජාවාරමෙහි යෙදී සිටිති. අනෙකුත් අය වන්නේ ආරක්ෂක තත්ත්වයේ පවතින දුර්වලතාවයන් ප්‍රයෝජනයට ගනිමින් කටයුතු කරන දේශීය අනු හමුදාවන්, කල්ලි හෝ දේශපාලන සටන්කාමීන් වේ. කප්පම් ගැනීම, සේවාවන් ලබාදීම හා ආරක්ෂාව සැපයීම යන දේවල් හරහා ඔවුන් තමන්ට සහය දක්වන

කණ්ඩායම් ගොඩ නගා ගනිති. ඔවුන්ගෙන් බොහෝ අය කාන්තාවන් පිළිබඳ නිශ්චිත වශයෙන් මතවාදයන් දරන කණ්ඩායම් වේ. කාන්තාවන් අධ්‍යාපනය ලබාගැනීමට හා සමාජ ජීවිතයට සම්බන්ධවීමට තිබෙන අවස්ථාවන්ට ඔවුන් බාධා කරන අතර, චාරිත්‍ර කඩ කරන අයට දැඩි දඬුවම් ලබාදෙති. නෛතික සීමාවන් හා ලිංගික වහල්භාවය වැනි ශාරීරික අපයෝජන හරහා ඔවුන් ප්‍රසිද්ධියේ කාන්තාවන් මර්දනයට ලක් කරති. කැරළි කණ්ඩායම්, අන්තවාදී ව්‍යාපාර හා සැලසුම් සහගත අපරාධ කල්ලි අතර පවතින සබඳතාවන් ද දේශ සීමාවන් ඉක්මවා පැතිරී තිබේ, විශේෂයෙන් ස්වභාවික සම්පත් සම්බන්ධයෙන් පුද්ගලික අංශය ද වැදගත් කාර්යභාරයක් ඉටුකරයි.

වසර 2500 ක් පුරා හමුදා හා දේශපාලන ඉහළ පැළැන්තිය - බොහෝ විට පිරිමින් - යුද්ධය හා සාමය තීරණය කර ඇත. කෙසේ වෙතත්, යුද්ධයේ ස්වභාවය වෙනස්වීමත් සමඟ සාමය, ගොඩනැගීමේ ක්‍රියාවලියද අප වෙනස් කළ යුතුව ඇත.

## ප්‍රජාතන්ත්‍රීකරණය හා සාමය ගොඩනැගීමේ ක්‍රියාවලියේ විකාශනය

මෙම තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන්, බොහෝ අවස්ථාවල ඵලදායි රාජ්‍ය

සේවාවන් නොමැති පසුබිමක් තුළ හෝ සූරාකෑමේ ලක්ෂණයකින් යුත් රාජ්‍යයක් පවතින තත්ත්වයක් තුළ - ජාතික හා ජාත්‍යන්තර මට්ටම්වල රාජ්‍ය නොවන නිරායුධ ක්‍රියාධරයින් හෝ ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ සක්‍රීය ලෙස ක්‍රියාත්මක වන සිවිල් සමාජ සංවිධාන මතුවී, ගැම්මක් ලබාගෙන ඇත. ගෝලීය හා කලාපීය ජාලවල සිට නැගී එන බහුජන ව්‍යාපාර දක්වා සාමාන්‍ය පුරවැසියන් ප්‍රචණ්ඩත්වයට හා පීඩනයට එරෙහිව - බොහෝ අවස්ථාවල දැඩි අවධානමකට මුහුණදෙමින් - යම් ස්ථාවරයක සිටිති.

පසුගිය දශක දෙක තුළ ගැටුම් නිරාකරණය හා ගැටුම් විපරිවර්තන ක්ෂේත්‍රය දැනුමින් හා භාවිතයෙන් සංවර්ධනය වී තිබේ. රාජ්‍ය හා විශේෂයෙන් රාජ්‍ය නොවන සංවිධාන සාමය ගොඩනැගීම, සමථකරණය හා ගැටුම් නිරාකරණය යන දේවල් පිළිබඳ නිපුණතාවයක් ලබා ගෙන ඇත. එම සංවිධාන විධිමත් මාර්ගය I මට්ටමේ සබඳතා ගොඩනැගීමේ ක්‍රියාවලියේ හා II මට්ටමේ අවිධිමත් (නමුත් අවදානම් සහිත) සම්බන්ධතා ගොඩනැගීමේ මූලික ක්‍රියාකාරකම් වල යෙදී සිටිති.

සමථකරණයේ හා ගැටුම් නිරාකරණයේ සම්බන්ධවන ක්‍රියාධරයන්ගේ සංඛ්‍යාවේද වැඩවීමක් සිදුවී තිබේ. එම ක්‍රියාධරයන් විවිධත්වයක් ද පෙන්නුම් කරති. අනිත් අතට සීතල යුද්ධය පැවති කාලයේ ඇමෙරිකාව හා සෝවියට් සමූහාණ්ඩුව ගැටුම් පාර්ශ්වයන්ට උදව් උපකාර කළ ප්‍රධාන රටවල් විය. සාමය ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලියේදී ද එම රටවල් දෙක වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. අද සමථකරණය, සාම සාකච්ඡාවලට අනුබල දීම හා තමන්ගේ උත්සාහයන්ට පිළිගැනීමක් ලබා ගැනීම යන දේවල් පිළිබඳ රාජ්‍යයන් හා කලාපීය සංවිධාන අතර තරඟයක් පවතී. පුද්ගලික සමාගම්, ආගමික සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා තනි පුද්ගලයන් ඇතුළු බොහෝ රාජ්‍ය නොවන පාර්ශ්වයන් සමථකරණයේ හා ගැටුම් නිරාකරණයේ යෙදී සිටිති. ජාතික වශයෙන්ද ස්වාධීන, අවිහිංසාවාදී හා සාමයට නැඹුරු වූ සංවිධාන බිහිවී තිබේ. ලතින් ඇමෙරිකාවේ දශක කිහිපයක සන්නද්ධ විමුක්ති කණ්ඩායම් වල ක්‍රියාකාරිත්වයෙන් පසු, නිරායුධ සමාජ ව්‍යාපාර යුක්තිය හා අයිතීන් වෙනුවෙන් පෙරමුණේ සිටිති. ප්‍රචණ්ඩත්වය අවම කිරීමේ හා වැළැක්වීමේ ක්ෂේත්‍රයේ සාමය හා ගැටුම් නිරාකරණ සංවිධාන ඇතුළත් ජාලයන්

දකුණු අප්‍රිකාව පුරාම ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරමින් සිටියි. ගැටුම් විපරරිවර්තන සංකල්පය - ප්‍රචණ්ඩත්වයට යොමු නොවී ගැටුම් පාලනය කිරීමේ හැකියාව - විවිධ ආකාරයෙන් ක්‍රියාවට නංවා ඇත. දකුණු අප්‍රිකාවේ හා කෙන්යාවේ ඒ ඒ ප්‍රදේශවල ජීවත්වන විවිධ ප්‍රජාවන්ගේ නියෝජිතයන්ගෙන් සැදුම් ලත් සාම කමිටුවලට උණුසුම් තත්ත්වයන් පාලනය කිරීම හා ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා පුහුණුව ලබා දී ඇත. ලයිබීරියාවේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයද ඇතළු ස්ථානීය ප්‍රජාවගේ ආරවුල් ඉදිරිපත් කිරීමටත්, විසඳා ගැනීමටත් පලාවා මඩු (Palava Huts) අවස්ථාවන් ලබාදී තිබෙ. සෙනීගල් රටේ මැතිවරණ ප්‍රචණ්ඩත්වය අවම කිරීමේ කාර්යයේ ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධානයක් විසින් මෙහෙයවන Women's Situation Room යන සංවිධානය මැතිවරණ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. සිරියාවේ-ඉතා ප්‍රචණ්ඩ වාතාවරණයක් මැද වුවද-වර්ධනය වන සාම සංවිධාන ප්‍රජා සමථකරණයේ යෙදී සිටින අතර, යුද්ධයෙන් විපතට පත්වූවන්ට උදව් උපකාර ලබා දෙයි. එම සංවිධාන ජාත්‍යන්තර වශයෙන් අධිවාචන (Advocacy) ක්‍රියාවල යෙදීමේ ධාරිතාවයද ලබාගෙන ඇත.

සිවිල් සමාජ සංවිධාන සතුව සීමිත සම්පත් පමණක් තිබෙන අතර, එම සංවිධාන බලය පිළිබඳ සාම්ප්‍රදායික මතයන් අනුව දුර්වල ඒවා ලෙස සැලකේ. නමුත්, එම සංවිධාන මෘදු බලය යෙදීමේ ධාරිතාවයන් ලබාගෙන සිටිති. නව තාක්ෂණයන් හා සමාජ මාධ්‍යයන් ඔස්සේ ඒ ඒ ප්‍රදේශවල ජීවත්වන ප්‍රජාවන් සමග ඉතා පුළුල් ආකාරයෙන් සම්බන්ධ වී කටයුතු කිරීමේ හැකියාව - රජයන් මුහුණ දෙන බාධකවලින් තොරව-මෙම සංවිධාන සතුව තිබේ. ප්‍රජාවන් අතර විශ්වාසය ගොඩනැගීම, ප්‍රදේශ අතර අත්දැකීම් බෙදා හදා ගැනීම, සංවාදයන් කෙරෙහි බලපෑම් කිරීම, විසඳුම් කරා යොමු කරන උපාය මාර්ගයන්ට සහයෝගය ලබාදීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේ හැකියාව ද ඔවුන් සතුව ඇත. අන්තවාදී මතවාදයන් හිස ඔසවන වටපිටාවක් තුළ විවිධත්වය හා සහජීවනය පෝෂණය කරන අවකාශයක් එම සංවිධාන ලබා දෙයි.

## විකාශනය වන රාජ්‍යතන්ත්‍රික කලාව:-

නව යථාර්තයන්ට ප්‍රායෝගික ප්‍රතිචාරයන් මෙවැනි යථාර්තයන්ට මුහුණ දෙන පසුබිම තුළ, ජාත්‍යන්තර රාජ්‍යතන්ත්‍රික ප්‍රජාවද සිය භාවිතයන් යොදාගෙන ඇත. මෙහි සිදුවී

තිබෙන වැදගත් සංර්ධනයක් වන්නේ රාජ්‍ය නොවන නිරායුධ ක්‍රියාධරයන් පිළිගැනීමට ලක් කර, ඔවුන් සමඟ සෘජුව ගනුදෙනු කිරීමට රාජ්‍යයන් හා බහුජාතික ආයතන වැඩි වශයෙන් දක්වන කැමැත්ත වේ. 1990 ගණන්වල මුලදී (මොසාම්බික් රටේ RENAMO, සියාරා ලියෝන්හි RUF/SL හෝ එල්සල්වඩෝර්හි FMLN වැනි) රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් සමඟ සිදුකල අන්තර් සබඳතා එක්සත් ජාතීන්ගේ සංවිධානයටත්, කලාපීය රාජ්‍ය සංවිධානවලටත් අභියෝගාත්මක දෙයක් විය. එවැනි පරිචයන් එක්සත් ජාතීන්ගේ හර පද්ධතියට අභියෝගයක් විය හැකි බව බියක් පැවැතිණි. සමහර අංශවල තවමත් එය බිය පවතී. මැදිහත් නොවීම හා රාජ්‍යයන්වල ස්වෛරීභාවයට ගරු කිරීම යන මූලධර්මයට එය පටහැනි බවට බියක් පවතී. එවැනි කණ්ඩායම්වලට නීත්‍යානුකූලභාවය ලබාදීම හෝ ත්‍රස්තවාදීන් සමඟ සාකච්ඡා පැවැත්වීම පිළිබඳ වාද විවාද සිදු වූ අතර, එය පිළිබඳ කණස්සල්ලද පළවිය.

පසුගිය දශකයේ අනුගමනය කරන ලද දැඩි ත්‍රස්ත විරෝධී ප්‍රතිපත්තීන් හා සම්බාධක මධ්‍යයේ වුවද ප්‍රායෝගික යථාර්තය ජය

ගත්තේය, අඛණ්ඩව සිදුවෙමින් පවතින අභ්‍යන්තර ගැටුමක ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා ජාත්‍යන්තර ත්‍රස්තවාදී ලැයිස්තුවට ඇතුළත් කර ඇති කණ්ඩායම් ද ඇතුළුව- සන්නද්ධ කණ්ඩායම් සමඟ - රාජ්‍ය හෝ වේවා රාජ්‍ය නොවන කණ්ඩායම් හෝ වේවා - ගනුදෙනු කිරීම හැර වෙන විකල්පයක් නොමැති බව ඉහළ පෙළේ ක්‍රියාධරයන් පිළිගනිති. සමහර අවස්ථාවල, වාමාංශික සන්නද්ධ ව්‍යාපාරවලට සෝවියට් සහය නොලැබීම හා එම සහය ඉවත්කර ගැනීම හේතුවෙන් මෙම පියවරට යොමුවීමට සිදුවිය. උදාහරණයක් වශයෙන් 1990 ගණන්වලදී ලතින් ඇමෙරිකාවේ හා අප්‍රිකාවේ ක්‍රියාත්මක වූ එවැනි කණ්ඩායම් සාකච්ඡා මඟට පිවිසිය. බොහෝ රාජ්‍ය නොවන කණ්ඩායම් වල- විශේෂයෙන් ස්වයං නිර්ණය අයිතිය වෙනුවෙන් සටන් වැදී සිටින කණ්ඩායම්වල - ඉල්ලීම් හා දුක්ගැනවිලි නීත්‍යානුකූල ඒවා ලෙස සැලකිල්ලට ගැනීම සඳහා රාමුවක් ලබාදීමේ දී ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ සම්මතයන් වැදගත් කාර්යභාරයක් ඉටුකර ඇත.

රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් සමඟ සාකච්ඡා පැවැත්වීමට අමතරව, සාකච්ඡාවලදී සමාන ඉඩකඩ ලබාගැනීමට උදව්

කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාව මූලික සහයෝගය ද ලබාදෙයි. වත්මනෙහි සමථකරණ උත්සාහයන්වල යෙදී සිටින එක්සත් ජාතීන්ගේ සංවිධානය හා බොහෝ රාජ්‍යයන්, රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් සාම සාකච්ඡාවල සහභාගීවීමට හැකිවන පරිදි තාක්‍ෂණික සහය, ආරක්‍ෂාව පිළිබඳ තහවුරුවන් හා පොදු පහසුකම් වැනි දේවල් ලබාදෙති. සමහර අවස්ථාවලදී එම කණ්ඩායම් වලට මුල්‍යාධාරද ලබාදෙනු ලැබේ. මෙය අන්‍යෝන්‍ය ලැදියාවකි. රාජ්‍ය පදනම් කරගත් සංවිධානයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය කෙරෙහි සාමාන්‍යයෙන් අවිශ්වාසයෙන් පසුවිය හැකි රාජ්‍ය නොවන කණ්ඩායම් පවා එක්සත් ජාතීන්ගේ තානාපතිවරුන් සමඟ කටයුතු කිරීමට කැමැත්තෙන් සිටිති. එක්සත් ජාතීන්ගේ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන්ට රාජ්‍ය නොවන විපක්‍ෂය හා සන්නද්ධ කණ්ඩායම් සමඟ සබඳතා පැවැත්වීමට සාමාජික රාජ්‍යයන් අවසර ලබාදීම මෑතක සිදුව ඇති වෙනසක් බව පැහැදිලිව පෙනේ.

එක් පැත්තකින් රජයන් හා බහුපාර්ශ්වික සංවිධාන අතර වර්ධනය වෙමින් තිබෙන සහයෝගීතාවය හා අනෙක් පැත්තෙන්

ජාත්‍යන්තර සමථකරණ හා සාමය ගොඩනැගීමේ සංවිධානවල වර්ධනය ද මෑත කාලයේ සිදු වූ වෙනසකි. මෙම ක්ෂේත්‍රයට පළමුවෙන් අවතීර්ණ වූ සංවිධාන අතර කාර්ටර් මධ්‍යස්ථානයද එකකි, එක්සත් ජාතීන්ගේ සංවිධානය හා නෝර්වේ, පින්ලන්තය, ස්විටසර්ලන්තය රජයන් හා අනෙකුත් රජයන් අඛණ්ඩව Humanitarian Dialogue, Swisspeace හා Crisis Management Initiative වැනි ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සමඟ හවුල් වී කටයුතු කරති. ආරාවුල් ඵලදායි ආකාරයෙන් විසඳා ගැනීම සඳහා වූ අප්‍රිකානු මධ්‍යස්ථානය (ACCORD) සාමය සඳහා වූ බටහිර අප්‍රිකානු ජාලය (WANEP) හා ලතින් ඇමෙරිකාවේ SERAPAZ සංවිධානය රාජ්‍ය නොවන කණ්ඩායම් සමඟ සම්බන්ධවීමට පහසුකම් සලසන අතර, ප්‍රජා මූලික සාමය ගොඩනැගීමේ ප්‍රයත්තයන්ට මූලිකත්වය ලබා දෙති.

නොදැනුවත්ව සිදුවන වැරදි මඟහරවා ගැනීම සඳහා අදාළ තේමාව පිළිබඳ හෝ නිශ්චිත පසුබිම පිළිබඳ නිපුණත්වයක් සාම ක්‍රියාවලියක යෙදී සිටින සමථකරුවන් හා සාකච්ඡා පාර්ශ්වයන් සතුව තිබිය යුතුයි යන කරුණ එක්සත් ජාතීන්ගේ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්

ඇතුළු ජාත්‍යන්තර ප්‍රජාවට අවබෝධ වී තිබේ. ගිවිසුම්වලට එළඹ වූ නමුත් (නිරායුධකරණය හෝ මැතිවරණ සඳහා යථාර්ථවාදී නොවන කාල රාමු නිර්ණය කරගැනීම වැනි) සංවිධාන කටයුතු පිළිබඳ යථාර්ථයන් හේතුවෙන් ඒවා ක්‍රියාත්මක කිරීම අවහිර වූ හෝ අසාර්ථකවූ අවස්ථා තිබුණි.

"සිරියාවෙ'' අවි නොගත් කාන්තාවන් තවමත් සාමයේ බලය හා සාමයේ සංකේතයක් ලෙස සිටිති. මෙම කාන්තාවන් අනෙකුත් සිවිල් සමාජ සංවිධානවලට අයත් පුද්ගලයන් ඇතුළත් කර නොගන්නේ නම් මාගේ රටේ සාමයක් ඇතිවිය නොහැකිය.

**ආචාර්ය රීන් තුරුක්මානි**
- තාරකා භෞතික විද්‍යාඥවරිය හා Building The Syrian State සංවිධානයේ සම නිර්මාතෘ.



මෙම දුර්වලතාවය ආමන්ත්‍රණය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ දේශපාලන කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් 2008 වසරේදී සමථකරණ සහය ඒකකය (Mediation Sopport

Unit) පිහිටුවන ලදී. සමථකරණ ක්‍රියාවලියේ යෙදීමට අවශ්‍ය තම සංවිධානයේ ධාරිතාවය ගැඹුරු කිරීම සඳහාත්, ව්‍යාප්ත කිරීම සඳහාත් එය කරන ලදි. සාමාන්‍යයෙන් සාම සාකච්ඡාවල පොදුවේ දක්නට ලැබෙන බලය බෙදා ගැනීම, ව්‍යවස්ථාවන්, ආරක්ෂාව හා සම්පත් වැනි ගැටලු ආමන්ත්‍රණය කිරීම පිණිස බාහිර නිපුණතාවයන් ලබා ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ සමථකරණ උපදේශකවරුන්ගෙන් සැඳුම්ලත් සූදානමින් සිටින කණ්ඩායමක් (Standby Team) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මේ සඳහා ස්ථාපිත කරන ලදී. සමථකරණ ක්‍රියාවලිය සැලසුම් කිරීම, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා ඇතුළත් කරගැනීම පිළිබඳ විශේෂඥයන් සමඟ 2011 වසරේදී මෙම කමිටුව පුළුල් කරන ලදී.

**ප්‍රමාණික විකාශනය:- ක්ෂේත්‍ර යථාර්ථයන් කාන්තාවන් ඇතුළත් කරගැනීම සඳහා වූ ඉල්ලීම ඉදිරියට රැගෙන යයි.**

පසුගිය දශක දෙක තුළ සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නීතිවල කැපී පෙනෙන දියුණු තත්ත්වයන් ඇති වී තිබේ. කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ යෝජනාව අංක 1325 ( හා මේ සඳහා

න්‍යායපත්‍රයක් සකස් කර ගැනීමට ඉවහල්වන ආකාරයෙන් පසුව සම්මත කර ගන්නා ලද යෝජනා හත - බලන්න ඇමුණුම් I) මෙම ක්ෂේත්‍රයේ සිදුවූ ඉතා වැදගත් වර්ධනයන් වේ. යුධ වාතාවරණයක් තුළ ජීවත්වීමෙන් හා සාමය සඳහා වැඩ කිරීම තුළින් කාන්තාවන් ලබාගෙන ඇති අත්දැකීම් සැලකිල්ලට ගෙන, ඉදිරිපත් කර ඇති මෙම න්‍යාය පත්‍රය, සාමය ගොඩනැගමේදී හා ආරක්ෂාව ස්ථාපිත කිරීමේදී කාන්තාවන් ඉටුකරන වැදගත් කාර්යභාරය හා ඔවුන් එයට ලබාදෙන දායකත්වයන් පිළිගනියි. යුද්ධය හා සාමය සම්බන්ධ සාකච්ඡාවලට සහභාගීවීමේ කාන්තාවන්ගේ අයිතියද, සහනාධාර ලබාදීම, නැවත ප්‍රකෘති තත්ත්වයට පත්වීම හා පශ්චාත් ගැටුම් ක්‍රියාකාරකම්වලදී කාන්තාවන්ගේ හා පිරිමින්ගේ වෙනස් වූ අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කිරීමේ වැදගත්කමද (එනම් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී බව) එය පිළිගනියි.

> "යුද්ධය පිරිමින්ගේ කර්මාන්තය වේ නම් සාමය කාන්තාවන්ගේ කර්මාන්තය වේවා."
>
> **අබල් භාෂා**
>
> - යෙමන් ජාතික සංවාද සමුළුවේ සාමාජික

1325 යෝජනාව වෙනුවෙන් හඬ නැගූ පුද්ගලයන්ට, කාන්තා මූලික සාමය පදනම් කරගත් සිවිල් සමාජ කණ්ඩාම්වල සහභාගිත්වය ප්‍රධාන අභිප්‍රේරණ සාධකයක් විය. මෙය ''කාන්තාවන් සාමය ගොඩ නගයි.'' යන ප්‍රධාන පණිවුඩය හරහා ප්‍රකාශ වූ අතර, ගැටුම් වැළැක්වීමේ දී හා විසඳීමේ දී මෙවැනි කණ්ඩායම් සැලකිය යුතු දායකත්වයන් ලබාදෙයි. කෙසේ වෙතත්, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය 2000 වසරේ දී ''සිවිල් සමාජය'' යන වචනයට විරුද්ධ විය. කලින් යෝජනාවල පිටපතක ''දේශීය හා ප්‍රාදේශීය ගැටුම් විසඳීමේ ක්‍රම'' හා ''කාන්තාවන්'' යන වචන පොදුවේ සඳහන් කර තිබුණි. ඉන්පසු ඉදිරිපත් වූ යෝජනාවල ඇතුළත් වචනවල වෙනස්වන ස්වභාවය, ආකල්පවල හා ප්‍රතිපත්තියේ ක්‍රම ක්‍රමයෙන් සිදුවෙමින් පවතින වෙනස්කම් පෙන්නුම් කරයි. 2008 වසරේ දී යෝජනා අංක 1820 සම්මත වූ අවස්ථාවේ දී මීට කලින් මෙම න්‍යාය පත්‍රයට දැඩි ලෙස විරුද්ධ වූ අය පවා ''සිවිල් සමාජය'' යන වචනයට විරුද්ධ වූයේ නැත. ඉන්පසු පිටපත්වල - විශේෂයෙන් 1889 හා 2122 යෝජනාවල - සිවිල් සමාජයට අයත් කාන්තාවන් යන යෙදුම සාමාන්‍ය ව්‍යවහාරයක් විය.

මෙම න්‍යාය පත්‍රය බොහෝ අවස්ථාවල කාන්තාවන් හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ගැටලු පමණක් ආමන්ත්‍රණය කරන එකක් ලෙස සැලකෙන නමුත්, එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ජාත්‍යන්තර ක්‍රියාධරයන් රාජ්‍ය නොවන ගැටුම් විසඳීම සඳහා ප්‍රයත්නයක් දැරිය යුතු බවටත්, එවැනි ගැටුම් වලට සම්බන්ධ පාර්ශ්වයන් සමඟ කටයුතු කළයුතු බවත් එය ඉල්ලා සිටියි. එය මෙම න්‍යාය පත්‍රය බලවත් ලේඛණයක් බවට පත්කරන සාධකයකි. හමුදා මැදිහත්වීම් සඳහා දොරවල් විවෘත නොකිරීමෙන් සාමය ස්ථාපිත කිරීම මුළුමනින්ම රාජ්‍යයන් කළයුතු දෙයක් යන අදහසට එය අභියෝග එල්ල කරයි. එය වෙනුවට අවි භාවිතයෙන් තොරව වෙනසක් බලාපොරොත්තු වන ජාතික රාජ්‍ය නොවන ක්‍රියාධරයන් සමඟ ජාත්‍යන්තර ප්‍රජාව නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා මෙම න්‍යාය පත්‍රය අවස්ථාවක් ලබා දෙයි. එය සාම සාකච්ඡා හුදෙක්ම දේශපාලන හා ආරක්ෂාව පදනම් කරගත් ක්‍රියාමාර්ගයක් වශයෙන් නොව සමාජයීය ක්‍රියාවලියක් ලෙස පරිවර්තනය කරයි.

සාමය ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියේ නියුතු කාන්තාවන් යුද්ධයේ මානුෂීය මුහුණුවර ඉස්මතු කිරීමට කටයුතු කරති. සහන, ප්‍රකෘති

තත්ත්වය නැවත ස්ථාපිත කිරීම හා සමාජ සාධාරණත්වය යන කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සාම සාකච්ඡා සිදු කරන පටු සංකල්පයට ඔවුන් අභියෝග එල්ල කරති. එම නිසා සාමය ස්ථාපිත කිරීමේ දී කාන්තාවන් සම්බන්ධ කර ගැනීම මගින් එදිරිවාදිකම් අහෝසි කිරීම හා බලය බෙදා ගැනීම වැනි පටු අදහස්වලින් ඔබ්බට සාකච්ඡා රැගෙන යා හැකිය. යුද්ධයෙන් විපතට පත් වින්දිතයන් හා ප්‍රජාවන් සඳහා වගකීම් බෙදා ගැනීම හා සියලු පාර්ශ්වයන් ඇතුළත් කර ගන්නා ප්‍රජාතන්ත්‍රවාදී අනාගතයක් ගොඩනැගීම දක්වා එය පුළුල් කිරීමට කාන්තාවන්ගේ සහභාගිත්වය ඉවහල්වනු ඇත.

"සාකච්ඡා මේසයට (කාන්තාවන්ද) ඇතුළත් කරගැනීම පශ්චාත් ගැටුම් පසුබිමක කාන්තාවන් ඇතුළත් කරගැනිමේ අභ්‍යාසයකි. මෙම මොඩලය, සාකච්ඡා අවසන්වීමෙන් පසු (සියලු පාර්ශ්වයන්) ඇතුළත් කර ගන්නා ක්‍රියාවලීන් පෝෂණය කර සැකසිය යුතුය."

**වේර්ජිනියා බෝවියර් - එක්සත් ජනපදයේ සාම ආයතනයේ ජ්‍යෙෂ්ඨ උපදේශක**

යෝජනා 1325 න්‍යාය පත්‍රය විශාල වෙනසක් ඇති කිරීමේ අඛන්ඩ හැකියාව සතුව ක්‍රියාත්මක වෙයි. යුරෝපා සංගමය, අප්‍රිකානු සංගමය හා ඇමෙරිකානු ප්‍රාන්ත රාජ්‍ය සංගමය

ඇතුළුව කලාපීය සංවිධාන එවැනි යෝජනාවන් සම්මත කරගෙන ඇත. දැනට රටවල් පනහකට අධික ප්‍රමාණයක් ජාතික ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කරන අතර, එම සැලසුම් සාමය ස්ථාපිත කිරීමේ හා ආරක්ෂාව සම්බන්ධ ක්‍රියාවලීන්වල කාන්තාවන් ඇතුළත් කරගැනීම අත්‍යවශ්‍ය කර ඇත. ගැටුම් සිදුවන බොහෝ ස්ථානවල, මෙවැනි ක්‍රියාකාරී සැලසුම්වල අවශ්‍යතාවය සඳහා සාමය ස්ථාපිත කිරීමේ යෙදී සිටින කාන්තාවන් අවධාරණය කර ඇති අතර සාම හා දේශපාලන ක්‍රියාවලීන්වල තමන් ද ඇතුළත් විය යුතුයි. යන ඉල්ලීම ශක්තිමත් කිරීම සඳහා 1325 න්‍යාය පත්‍රය යොදාගෙන ඇත. සම්පත් හා දේශපාලන කැමැත්ත ප්‍රමාණවත් ලෙස නොලැබීම හේතුවෙන් 1325 න්‍යාය පත්‍රය නිසි අයුරින් ක්‍රියාත්මක නොවේ නමුත් මෙම න්‍යාය පත්‍රය අදාළ ප්‍රදේශයට ගැලපෙන ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා වූ සැලසුම් හා ප්‍රයත්නයන්, ගෝලීය ප්‍රමිතීන් ජාතික මට්ටමේ ස්ථාපිත කිරීමට අවශ්‍ය අවකාශය බිහිකර ඇත. තවද මෙම න්‍යාය පත්‍රය. පිරිමින්, සාමය හා ආරක්ෂාව හා තරුණ තරුණයින්. සාමය හා ආරක්ෂාව. යන මාතෘකාවන් පිළිබඳව ගෝලීය වශයෙන් සාකච්ඡා කිරීමට ද අවස්ථාව උදා කර තිබේ.

"ක්ෂේත්‍රයෙන් පැත්තකට තල්ලු කරන ලද හෝ දුරස්ථ කරන ලද ඕනෑම කණ්ඩායමක් වෙනසක් සිදු කිරීම සඳහා වූ අතිමහත් ධාරිතාවයන් උනන්දුව හා විශ්වාසය සතුව සිටියි"

**එස්රා තාබිට් -**
නීතිවේදී හා කාන්තා අයිතීන් පිළිබඳ ක්‍රියාධාරිනිය. යෙමන්

තුර්කිය හා පිලිපීනය යන රටවල සම අනුග්‍රහයෙන් එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩලයට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද 65/283 (2011) යෝජනාව තුළින් එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් අතර ආරාවුල් සාමකාමීව සමථයට පත් කිරීම සඳහා බලවත් සහයෝගයක් ලැබුණි. මෙම යෝජනාව, සියලු පාර්ශ්වයන් ඇතුළත් කර ගැනීම හා විශේෂයෙන් කාන්තාවන්ගේ සහභාගිත්වය අවධාරණය කරයි. මෙම යෝජනාව හා අනෙකුත් මෙහෙයුම් හා ප්‍රමිතීන්වල සිදුවූ වෙනස්කම් අනුව, එක්සත් ජාතීන්ගේ සංවිධානය සාර්ථක සමථකරණය සඳහාවූ පළවෙනි මඟපෙන්වීම (2012) නිකුත් කළේය. සමථකරුවන් හා මෙම ක්‍රියාවලියේ යෙදී සිටින පුද්ගලයන් සමඟ ගෝලීය වශයෙන් සිදුකළ සාකච්ඡා පදනම් කරගෙන මෙම ලේඛණය ප්‍රධාන පාඩම්වල සාරාංශය ඉදිරිපත් කරන අතර▫ සාර්ථක ක්‍රියාවලියක් සඳහා "සමථකරණ මූලිකාංග" අටක් පෙන්වා දෙයි.

1. සමථකරණ කණ්ඩායමේ සුදානම් තත්ත්වය
2. පාර්ශ්වකරුවන් කෙරෙහි අපක්ෂපාතිත්වය, නමුත්, අවශ්‍යයෙන්ම මධ්‍යස්ථභාවය නොවේ. විශේෂයෙන්, අපක්ෂපාතිත්වය විශ්වය මානව හිමිකම් ප්‍රමිතීන්ට සම්බන්ධ වේ.
3. සමථකරණ ප්‍රයන්තවල යෙදී සිටින පුළුල් පරාසයක ක්‍රියාධරයන් අතර ගැලපීම හා සම්බන්ධීකරණය.
4. යහපත් විශ්වාසයකින් සාකච්ඡාවේ යෙදීමට පාර්ශ්වකරුවන්ගේ එකඟතාවය හා කැමැත්ත.
5. ක්‍රියාවලිය, ප්‍රතිඵල හා ගිවිසුම් ක්‍රියාත්මක කිරීමපිළිබඳ ජාතික මට්ටමේ කැපවීම.
6. ජාත්‍යන්තර නීති හා ප්‍රමිති රාමුවලට අනුකූලවීම.
7. ගැටුම් පාර්ශවයන් හා අනෙකුත් පාර්ශ්වයන්ගේ විවිධ වර්ගවලට අයත් කණ්ඩායම් පුළුල් ලෙස ඇතුළත් කරගැනීම.
8. ගැටුම් විසදන අතර, ඉදිරියේදී එම ගැටුම් නැවත මතුවීම වළක්වා ගැනීමේ අරමුණින් යුතු ගුණාත්මක සාම ගිවිසුම.

## කොටුව 1 : එකතු කළ අගය
## සාමය ගොඩනගන කාන්තාවන් හා සාම සාකච්ඡාවල සිවිල් සමාජය සම්බන්ධවීම

සාමය හා සමථකරණ ප්‍රයත්නවල සිවිල් සමාජ ක්‍රියාධරයන් උදව්කර ඇති බව පර්යේෂණ පෙන්වා දෙයි.

√ **සාම ගිවිසුම්වල කල්පැවැත්මේ හැකියාව වැඩි දියුණු කිරීම.** 1989 සිට 2004 දක්වා එළඹ ඇති සාම ගිවිසුම් 83 ක් පිළිබඳ විශ්ලේෂණයක් පෙන්වා දෙන්නේ සිවිල් සමාජ සහභාගිත්වය තිබෙන අවස්ථාවල පාර්ශ්වයන් ගිවිසුම කඩ කරන අවස්ථා 64% ක් අඩු බවය.

(එමනිසා එය සාම ක්‍රියාවලීන්වල තිරසාරභාවය ඉහළ නංවයි).

√ **මහජනතාව වෙනුවෙන් අධීක්ෂකවරයෙකු ලෙස කටයුතු කිරීම.** සාකච්ඡා උපාය මාර්ගයක් වශයෙන් ප්‍රමාද කිරීමේ විධි ක්‍රම හෝ ප්‍රචණ්ඩත්වය පාවිච්චි කිරීම

වෙනුවට, පණිවිඩ ලබාදීම හා සජීවීකරණය හරහා ගිවිසුමකට එළඹෙන ලෙස සිවිල් සමාජය විසින් පාර්ශ්වකරුවන් වගවීමට පත්කර, ඔවුන් වෙත බලපෑම් කළ හැකිය.

මහජනතාවගේ පිළිගැනීම ලබාගැනිම සඳහා ක්‍රියාවලිය හා ගිවිසුම් අධීක්ෂණය කිරීම ගිවිසුම ක්‍රියාත්මක කිරීම, ජාත්‍යන්තර ක්‍රියාධරයන්ට තොරතුරු ලේඛනගත කිරීම හා බෙදා හැරීම-විශේෂයෙන් මහජනතාවට තොරතුරු ලබාදීම යනා-සමස්ථ ක්‍රියාවලියම සිවිල් සමාජය අධීක්ෂණය කරයි. සිවිල් සමාජ සංවිධාන ගැටුමෙන් විපතට පත් පුළුල් පරාසයක පුරවැසියන් නියෝජනය කිරීම හැර ක්‍රියාවලියට හා ප්‍රතිඵලවලට පක්ෂව හෝ විපක්ෂව මහජන මතය ගොඩනැගීමේදී වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.

√ **සමස්ථ ජනගහණයට වැදගත්වන ගැටලු මතු කිරීම:-**
ගැටුමක යෙදී සිටින පාර්ශ්වකරුවන් බොහෝ අවස්ථාවල තමන්ගේ ක්ෂණික අවශ්‍යතාවයන් හා බලය ලබාගැනීම යන කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරති. සාම සාකච්ඡාවල යෙදෙන අවස්ථාවල ගැටුමේ මතුපිට නොපෙනෙන හේතු ආමන්ත්‍රණය කිරීමෙන් හා මහජනතාවගේ පුළුල් ළැඳියාවන්, ප්‍රමුඛතාවයන් හා ඔවුන් කණස්සල්ලට පත් කරන කරුණු මනා ලෙස පිළිඹිබු කිරීම තුළින් සිවිල් සමාජ සංවිධානවලට එම සාකච්ඡාවල හරය වෙනස් කළ හැකිය. එසේ කරන විට, අත්සන් කරන ලද ගිවිසුම ක්‍රියාත්මක කිරීමට හා පවත්වාගෙන යාමට මහජනතාව වැඩි වශයෙන්

උනන්දුක් දක්වන නිසා එම ගිවිසුමට ජාතික පිළිගැනීමක් ලැබේ.

√ **ප්‍රශ්න විසඳා ගැනීමටත්, නව ප්‍රවේශයන් නිර්මාණය කර ගැනීමටත් අවස්ථාවන් ලබා දෙන්න,** සිවිල් සමාජ සංවිධානවල ක්‍රියාධරයන් සම්බන්ධ වන අවස්ථාවල ඔවුන් සාකච්ඡා සඳහා සමාන්තර හෝ මාර්ග II ක්‍රියාවලීන් සංවර්ධනය කර ගනී. නව අදහස් පරීක්ෂා කර බැලීමටත්, හවුල්වී විශ්ලේෂණය කිරීමටත් එය අවස්ථාවක් නිර්මාණය කරයි. එසේ නැත්නම්, දෙපැත්තේම දේශපාලන සංස්කෘතියේ වෙනසක් ඇති කිරීමට දායකත්වයක් ලබා දෙයි.

√ **විශාල සමාජ බැඳීමක් පෝෂණය කිරීම හා හිංසනය ප්‍රතික්ෂේප කිරීම,** සිවිල් සමාජ සංවිධානවල පහසුකරණය හරහා පීඩාවට පත් සාමාන්‍ය පුරවැසියන් පුළුල් ලෙස

ඇතුළත් කර ගැනීම, කල්පවතින සාමයක වැදගත් අංගයක් වේ. ක්‍රියාවලියෙන් හෝ එම ක්‍රියාවලිය හරහා ඇති කර ගත් ගිවිසුමෙන් තමන්ව බැහැර කර ඇති බව සිතන කණ්ඩායම්වල ප්‍රචණ්ඩකාරී ප්‍රතිචාරවලට මහජනතාවගෙන් ලැබෙන සහයෝගයද එය සීමා කරයි.

- √ **ඉතා වැදගත් තාක්ෂණික යෙදවුම් හා තොරතුරු ලබාදීම,** බොහෝ අවස්ථාවල සිවිල් සමාජ ක්‍රියාධරයන් (වින්දිතයන්ගේ අවශ්‍යතාවයන්, සම්පත් බෙදා ගැනීම, සිවිල් හා මානව අයිතීන් වැනි) තීරණාත්මක ගැටලු පිළිබඳ විශේෂඥ දැනුමක් සතුව සිටී. හෝ ක්‍රියාවලියට අවශ්‍ය අදාළ ප්‍රදේශ පිළිබඳ දැනුම ඔවුන්ට තිබේ.

- √ **විසඳුම් හා ප්‍රතිඵලයන් වැඩිදියුණු කිරීම සඳහා වැදගත්**

**දායකත්වයක් ලබාදීම,** සිවිල් සමාජ ක්‍රියාධරයන් අතීතයේ සිදුවූ I හා II පියවරයන්හි සාම ක්‍රියාවලීන් පිළිබඳ දැනුවත්ව සිටිති. දේශපාලන ක්‍රියාධරයන් මෙවැනි දැනුමින් තොර පුද්ගලයන් විය හැකිය. එම නිසා එක් එක් සාකච්ඡා වටයක හරය දැනුම් දීම අත්‍යාවශ්‍ය වේ.

## සියලු දෙනාම ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලියේ විවිධ පැතිකඩයන් : අදහස් හා නිර්වචන

සමථකරණ ක්‍රියාවලීන්වල සඵලත්වයට ඇතුළත් කරගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධ කිරීම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මඟපෙන්වීම් වලින් මතුකර දක්වා ඇති වඩාත්ම නිර්මාණාත්මක සංකල්පය වේ. ඇතුළත් කරගැනීමේ ක්‍රියාවලීන් - විශේෂයෙන් සිවිල් සමාජ සංවිධානවලට අයත් ක්‍රියාධරයන් ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලීන්- යහපත් ප්‍රතිඵලයන් ගෙන එන අතර, වැඩි සාර්ථකත්වයක් පෙන්වන බව ගුණාත්මක හා ප්‍රමාණාත්මක සාක්ෂි පෙන්වා දෙයි. සියලු පාර්ශ්වයන් ඇතුළත් කර ගැනීමෙන් පැන නැගිය හැකි ප්‍රායෝගික ගැටලු පිළිබඳ තවමත් සමථකරණ විශේඥයන් හා ජාත්‍යන්තර ශිල්පීය ක්‍රම පිළිබඳ විශේඥයන් අතර විවාදයක්, සැකයක්, අවිශ්වාසයක් හා චකිතයක් පවතී. පුළුල් පරාසයේ ක්‍රියාධරයන් ඇතුළත් කරගැනීම හේතුවෙන් අදාළ ක්‍රියාවලීන් සංකීර්ණ හා අවුල් සහගත තත්ත්වයන්ට පත් විය හැකි බවට සමහර අය තර්ක කරති. නමුත් මෙය බොරුවක් බව පූර්වාදර්ශ හා පර්යේෂණ පෙන්වා දෙයි. උදාහරණයක් වශයෙන් සන්නද්ධ කණ්ඩායම් හා පාර්ශ්ව 17 ක් බුරුන්ඩි සාම ක්‍රියාවලියට සහභාගි

විය. නේපාලයේ දේශපාලන පක්ෂ 8 ක් සහභාගි විය. එවගේම සෝමාලියාවේ සාම ක්‍රියාවලියට ආගමික හා ප්‍රජා නායකයින් බොහෝ දෙනෙක් දායකත්වය ලබා දුන්හ.

කෙසේ වෙතත්, '' ඇතුළත් කර ගැනීම, සඳහා වූ ඉල්ලීම'' අවුල් වියවුල් තත්ත්වයන්ටද මූලාශ්‍ර වී තිබේ නිර්වචන අනුව, මෙම සංකල්පය සියලු ක්‍රියාධරයන් පිළිපැදිය හැකි, තෝරා ගත හැකි සංකල්පයක් වේ.

එක පැත්තක් ඇතුළත් කරගැනීම හරහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හෝ තනි රාජ්‍යයන් විසින් ' ත්‍රස්තවාදි කණ්ඩායම' ලෙස නම් කර ඇති කණ්ඩායම් ද ඇතුළුව ගැටුම්වල සම්බන්ධ වී සිටින පුළුල් පරාසයේ සන්නද්ධ කණ්ඩායම් ඇතුළත් වේ. සාකච්ඡාවක් සාර්ථක විය යුතු නම්, කිසිම ජාත්‍යන්තර දේශපාලන බාධකවලින් තොර සියලු ක්‍රියාධරයන් සමඟ සබඳකම් පැවැත්වීමටත්, ගනුදෙනු කිරීමටත් තමන්ට හැකියාවක් තිබිය යුතු බව පළපුරුදු සහිත සමථකරුවන් බොහෝ අවස්ථාවල තර්ක කරති. උදාහරණයක් වශයෙන් Loard's Resitance Army (LRA) නැමැති උගන්ඩාවේ ක්‍රියාත්මක වූ සංවිධානය දීර්ඝ කාලයක් පිළිකුලට ලක්වී තිබූ සංවිධානයක් විය. නමුත්, එම

සංවිධානය සමඟ සබඳතා ගොඩ නගා ගෙන, සමථකරණයේ යෙදීමේ අවශ්‍යතාවය අවසානයේදී උගන්ඩා රජයට හා ජාත්‍යන්තර ප්‍රජාවට පිළිගැනීමට සිදුවිය. එවගේම ඇෆ්ගනිස්ථානයේ තලෙයිබාන් සංවිධානය සමඟ සාකච්ඡා පැවැත්වීම සඳහාවූ උත්සහයන් දැනට සිදුවෙමින් පවතී.

" කාන්තාවන් හා සිවිල් සමාජය සමඟ කටයුතු කිරීමටත්, එම කණ්ඩායම් ඇතුළත් කර ගැනීමටත් සමථකරුවන්ට කැමැත්තක් තිබේ නම්, ඔවුන් ඒ සඳහා මාර්ගයක්ද සොයා ගනී.

**සනම් නරාගි අන්ඩෙර්ලිනි**
**විධායක අධ්‍යක්ෂිකා *ICAN***

මෙහි අනෙක් අන්තයේ ගැටුම් කලාපවල සක්‍රියව ක්‍රියාකරන නමුත්, සාමාන්‍යයෙන් කොන් කර තබන ලද රාජ්‍ය නොවන අවි නොගත් සිවිල් සමාජ කණ්ඩායම් සිටිති. මෙම කණ්ඩායම් වලට සුළු ජාතීන්, කාන්තාවන්, තරුණ තරුණයින් හා අනෙකුත් සමාජ කොටස් අයත් වෙති. කාන්තාවන් මෙම ක්ෂේත්‍රයේ වැදගත් ක්‍රියාධරයන් ලෙස හා පාර්ශ්වකරුවන් ලෙස සිටින බව පසුගිය දශක දෙකක සිදුවීම් පෙන්වා දෙයි. සමහර කාන්තාවන් දැනටමත් ස්ථාපිත වී

තිබෙන සංවිධාන හරහා ක්‍රියා කරන අතර, තවත් කොටසක් ජනප්‍රිය ව්‍යාපාර හරහා ඉස්මතු වෙතිත හෝ මානුෂීය අර්බුදවලදී පළමුවෙන්ම ප්‍රතිචාර දක්වන්නන් ලෙස කරළියට එති. එය හරහා ඔවුන් ප්‍රජාව තුළ සාමය ගොඩනැගීමේ හා සංහිඳියාව ගොඩනැගීමේ ප්‍රයත්නවල සම්බන්ධ වෙති.

" ආරක්ෂක මණ්ඩලයේදී අපට කරුණු පැහැදිලි කළ මැන්ඩෙලා කියා සිටියේ කාන්තාවන් සමඟ කටයුතු කිරීමට පිරිමින් අකමැත්තක් දක්වන බවය. සවස් වරුවේදී ඔහු වාඩි වී (කාන්තාවන්ගේ) අදහස්වලට සවන් දෙන අතර, උදේ වරුවේ ඒවා (එනම් එම කාන්තාවන් ඉදිරිපත් කළ කරුණු) තමන්ගේම අදහස් මෙන් අන් අයට විස්තර කරයි. පිරිමින් එම අදහස්වලට කැමැති වූහ. අවසානයේදී මේවා කාන්තාවන්ගේ අදහස් බවත්, තමන්ගේ අදහස් නොවන බවත්, ඔහු (පිරිමින්ට) කීවේය ..............අවසන් වට දෙක සඳහා ඔහු කාන්තාවන් රැගෙන ආවේ ඒ ආකාරයටයි. "

**අන්වාරුල් සෞද්රි**
එක්සත් ජතීන්ගේ හිටපු
නියෝජ්‍ය මහ ලේකම්

අවි ගැවසෙන භූමිය හා අවි නොගත් සිවිල් සමාජය අතර විවිධ වර්ගයේ ක්‍රියාධරයන් සිටිති. සංවිධානද තිබේ. රජයේ ආයතන, දේශපාලන පක්ෂ, එම දේශපාලන පක්ෂවල බලයෙන් කටයුතු කරන පුද්ගලයන්, සාම්ප්‍රදායික නායකයන්, ව්‍යාපාරික ප්‍රජාව, විදෙස්වල සිටින ඩයස්පෝරා කණ්ඩායම්, වෙළඳ හා වෘත්තීය සංවිධාන යන කොටස් එයට ඇතුළත් වේ. ඊළඟ පිටුවේ තිබෙන ප්‍රස්තාර සටහන මෙහි සම්බන්ධ ක්‍රියාධරයන්, විභවයක් පවතින සමථකරුවන්, සාකච්ඡාකරුවන් හා ඇතුළත් කර ගත යුතු අනෙකුත් කණ්ඩායම් ආදී පාර්ශ්වයන් පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.

ඊළඟ පිටුවේ ඇති වගුවේ මෙහි සම්පත් ක්‍රියාධරයන් පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරන අතර, මෙම ක්‍රියාවලියට සම්බන්ධ විය හැකි සමථකරුවන්, සාකච්ඡාකරුවන් හා අනෙකුත් කණ්ඩායම් පෙන්වා දෙයි.

පසුගිය වසර 20 ක කාලය තුළ රාජ්‍ය නොවන අවි නොගත් ක්‍රියාධරයන් ඇතුළත් කර ගැනීමේ යම් ප්‍රගතියක් වාර්තා වී තිබේ. 1990 ගණන්වල ගෞතමාලාවේ ක්‍රිස්තියානි පල්ලියේ මෙහෙයවීමෙන් සිවිල් සමාජ සංවිධානවල

සම්මේලනයක් පිහිටුවන ලදි. එය දේශීය කණ්ඩායම්, වෘත්තීය සමිති නියෝජිතවරුන් හා අනෙකුත් අය ඒකරාශි කළ අතර, එම කණ්ඩායම් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුග්‍රහයෙන් පවත්වන ලද සාම සාකච්ඡාව කෙරෙහි බලපෑමක් එල්ල කළහ.

මෑතකදී එක්සත් ජාතීන්ගේ සංවිධානය හා අනෙකුත් සංවිධාන (සෝමාලියාවේ හා ඉරාකයේ සිදුවූ ආකාරයට) ආගමික නායකයන් හා ගෝත්‍රික නායකයන් සාම සාකච්ඡාවලට ඇතුළත් කරගැනීමට උත්සාහයන් දැරූහ.

## සියලු දෙනාම ඇතුළත් කරගන්නා සාම ක්‍රියාවලියට සම්බන්ධ වන පුළුල් ක්‍රියාධරයන්



ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය හා එක්සත් ජාතීන්ගේ සංගමයද ඇතුළත් ජාත්‍යන්තර ක්‍රියාධරයන් ඩයස්පෝරාව, ඒවාගේම පිටුවහල් කරන ලද පුද්ගලයන් හා කණ්ඩායම්වලට පිළිගැනීමක් ලබා දී ඇත. විශේෂයෙන් ඉරාකය, ඇෆ්ගනිස්ථානය, ලිබියාව හා සිරියාව පිළිබඳ මෙසේ සිදුවී ඇත. තමන්ගේ සමාජවල ඔවුන් දරණ ස්ථාවරය කුමක් වුවත්, ජාත්‍යන්තර ප්‍රජාව ඔවුන් නිත්‍යානුකූල නායකයන් වශයෙන් හා විරුද්ධ කණ්ඩායමක් වශයෙන් පිළිගැනීමට ලක්කර ඇත. එම නිසා සාමය හා පරිවර්තන ක්‍රියාවලීන්වල සහභාගීවීමේ අයිතිය ඔවුන් සතුව තිබෙන බව ජාත්‍යන්තර ප්‍රජාව පිළිගෙන ඇත.

සාම ක්‍රියාවලීන්වල සිවිල් සමාජය සම්බන්ධ වීම එහි ප්‍රතිඵලවල කිසිම සෘණාත්මක බලපෑමක් නොකරන බව ප්‍රායෝගික දත්ත පෙන්වා දෙන අතර, සංඛ්‍යාලේඛණ විශ්ලේෂණයන්ද එය තහවුරු කරයි. ඇත්ත වශයෙන්ම එසේ සිවිල් සමාජය සම්බන්ධ වීම, සාම ක්‍රියාවලීන් අසාර්ථක වීමේ අවස්ථා 50% කින් අඩු කරයි. තවද සාම ක්‍රියාවලීන්වල ශක්තිමත් කාන්තාවන්ගේ මැදිහත් වීම සාකච්ඡාවල අන්තර්ගතය හා ගුණාත්මකභාවය

කෙරෙහි බලපෑමක් ඇති කර. තිරසාර ගිවිසුම් ඇති කර ගැනීමේ අවස්ථා වැඩි දියුණු කරන බව ගුණාත්මක පර්යේෂණ පෙන්වා දෙයි.

## කාන්තාවන්ගේ වෙනස් වන ඉලක්කයන්

සියලුම ගැටුම්වල කාන්තාවන් සක්‍රියව ක්‍රියාකරන නමුත්, ඔවුන්ගේ දායකත්වයන් හා එහි ප්‍රතිඵලයක් වශයෙන් බිහි වී ඇති ශක්තිමත් ප්‍රතිමාණික රාමු කාන්තාවන් (විශේෂයෙන් සාමය ගොඩ නගන කාන්තාවන්) බොහෝ දුරට සාම ක්‍රියාවලීන් බැහැර කර ඇති බව පෙන්වා දෙයි. එම කොටස පිළිබඳ ජාත්‍යන්තර ප්‍රජාව වැඩි වශයෙන් හඬ නගා ඇති නමුත් ක්‍රියාකර ඇත්තේ ඉතාම අවම මට්ටමකිනි.

සාම ක්‍රියාවලීන්වල කාන්තාවන් ඇතුළත් කර ගත යුතු යැයි සඳහන් කිරීම. බොහෝ අවස්ථාවල සහභාගි වන අනිකුත් කණ්ඩායම් පිළිබඳ කලාතුරකින් අසනු ලබන ප්‍රශ්න ජාත්‍යන්තර ප්‍රතිපත්ති සම්පාදකවරුන් ඇසීමට පොළඹවනු ලැබේ. එම කාන්තාවන් බිම් මට්ටමේ කාන්තාවන් බව හෝ ඉහළ පැළැන්තිය පදනම් කර ගත් කාන්තාවන් බව දෝෂාරෝපණය කරනු ලැබේ. ඔවුන්ගේ සුදුසුකසම් හා ප්‍රජාවන් අතර ඔවුන්ගේ තත්ත්වය ගැන ප්‍රශ්න නගනු ලබන අතර, ඔවුන් මෙම ක්‍රියාවලීන්ට එකතු කරන අගය

පිළිබඳ හෝ ඔවුන්ගේ දායකත්වය පිළිබඳ සැක පළ කරනු ලැබේ. සමහර අවස්ථාවල ජාත්‍යන්තර ක්‍රියාධරයන් සාමය ගොඩ නඟන කාන්තාවන්ගෙන් අසාමාන්‍ය ඉල්ලීම් කරනු ලැබේ. උදා: වශයෙන් 2014 ජිනීවා II, සිරියානු සාකච්ඡාවලදී සිරියානු කාන්තාවන්ට ඔවුන්ගේ හැකියාව පෙන්නුම් කිරීමේ මාර්ගයක් ලෙස ප්‍රචණ්ඩකාරී අන්තවාදී කණ්ඩායම් නැවැත්විය හැකි දැයි රාජතන්ත්‍රිකයෙකු විසින් අසන ලදි. මෙම කාර්යය අද වන තෙක් කිසිම රජයකට කළ නොහැකි වූ කාර්යයක් වේ.

> සමථකරුවන් හා සාකච්ඡාකරුවන් කෙරෙහි සැහෙන ප්‍රමාණයක බලපෑම් කිරීමෙන් තොරව, කණ්ඩායමක් වශයෙන් කාන්තාවන් කිසි විටෙක සාකච්ඡාවලට ඇතුළත් කර ගෙන නැතත අනික් පැත්තට ආගමික කණ්ඩායම් වැනි සිවිල් සමාජයේ අනෙකුත් ස්ථරයන් ඕනෑකමින්ම බොහෝ අවස්ථාවල ඇතුළත් කර ගනු ලැබේ. සංවිධාන වූ ස්ථරයක් වශයෙන් කාන්තාවන් ඇතුළත් කර ගන්නා අවස්ථාවල හා සාකච්ඡා ක්‍රියාවලිය කෙරෙහි බලපෑම් කිරීමට ඔවුන්ට අවස්ථාවක් ලබා දෙන අවස්ථාවල ඔවුන් න්‍යාය පත්‍රයට වැදගත් කරුණු රැගෙන එන අතර එම කරුණු ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා කාන්තාවන්ගේ ගැටලුවලට පමණක් සීමා නොවේ. තවද කාන්තාවන් කිසි විටෙක සාකච්ඡාවකට සෘණාත්මක දායකත්වයක් ලබා දී ඇති බව පෙන්වා දිය නොහැකිය.
>
> **- ටානියා පැෆන්හොල්ස් -**
> ජිනීවා උපාධිධාරී ආයතනයේ
> සහභාගිත්වය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය

කාන්තාවන් ඇතුළත් කර යුතු යැයි කරන ඉල්ලීම බටහිර රාජ්‍ය නොවන සංවිධානවල බලපෑම හේතුවෙන් කරන ඉල්ලීමක් බවත්, එහි ප්‍රතිමාණික රාමුව යථාර්ථයට වඩා පරමාදර්ශී තත්ත්වයන් තුළ මුල් බැසගෙන තිබෙන බවත් දිගටම වැරදි මතයක් පවතී. මෙය නිශ්චිත සංස්කෘතික පසුබිම් තුළ පවතින කාන්තාවන්ගේ මතයන් සමඟ සම්බන්ධ වී තිබේ. උදාහරණයක් වශයෙන් සෝමාලියාවේ. සංක්‍රාන්ති ක්‍රියාවලියේ කාන්තාවන්ගේ සහභාගීත්වය පිළිබඳ ගැටළු 2011 වසරේදී මතු කළ අවස්ථාවේදී සෝමාලියාව සාම්ප්‍රදායික සංස්කෘතියක් පවතින රටක් බවත් බොහෝ එම සංස්කෘතිය තුළ කාන්තාවන්ට බලය හෝ බලපෑමක් නොමැති බවත් බොහෝ තානාපති නිලධාරීන් පැවසූහ. කෙසේවෙතත්, ප්‍රාණ ඇපකරුවන් මුදවා ගැනීම, ගුවන් තොටුපොල විවෘත කිරීම, වෛද්‍ය හා මානුෂීය සහනාධාර ලබා ගැනීම වැනි කරුණු පිළිබඳව සෝමාලියාවේ කාන්තාවන් අල්සබාබ් සංවිධානය සමඟ සාකච්ඡා පැවැත්වූහ. තමන්ගේ ප්‍රජාව හා තමන්ගේ ගෝත්‍රයන් තුළ එම කාන්තාවන්ගේ තත්ත්වය යුධ නායකයන් සමඟ සාකච්ඡා පැවැත්වීමටත් සන්නද්ධ කණ්ඩායම්වල ඉන්න පුද්ගලයන් නිරායුධ කිරීම සඳහා කඳවුරු ස්ථාපිත කර පවත්වාගෙන යාමටත් මැදිහත්වීම්

සඳහා ප්‍රාදේශීය වැඩිහිටි නායකයින් වෙත බලපෑම් එල්ල කිරීමටත් උපකාරී විය.

ඒවාගේම ඇෆ්ගනිස්ථානයේ කාන්තාවන් තලෙයිබාන් සංවිධානය සමඟ නිතිපතා සාකච්ඡා පවත්වයි. හෝ ප්‍රාදේශීය දේශපාලන ක්‍රියාවලීන්වල සම්බන්ධවී සිටී. එසේ තිබෙන නමුත්, ජාත්‍යන්තර ක්‍රියාධරයින් තලෙයිබාන් සංවිධානය කාන්තාවන් සමඟ සාකච්ඡා නොකරන බව දිගින් දිගටම කියා සිටි.

'' හැකියාවක් තිබෙන කාන්තාවන් නොමැති බව අපට කිව නොහැකිය. හැකියාවක් තිබෙන විශාල ප්‍රමාණයේ කාන්තාවන් සිටින අතර, තීරණ ගැනීමේදී, අපට ජනගහණයෙන් අඩකට වැඩි ප්‍රමාණයක් ඉවත් කිරීමට කිසිසේත්ම නොහැකිය.''

- **බෙටි ඔග්වාරෝ,**
(දකුණු සුඩානය) LRA
සංවිධානය හා උගන්ඩා රජය
අතර සමථකරණ කණ්ඩායමේ
සාමාජිකාවක්

## කොටුව 2 : කාන්තාවන් කියන්නේ මොනවාද ?
## සහභාගිවීම හා ආරක්ෂක මණ්ඩල යෝජනාව 1325

තෝරා ගත් ප්‍රධාන නිගමනයන්

1. බොහෝ රජයන්, එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයින් හා සිවිල් සමාජ සංවිධාන තවමත් ආරක්ෂක මණ්ඩල යෝජනාව 1325 පිළිබඳ න්‍යාය පත්‍රය නොදැනුවත්ව සිටිති. එය වැරදි ලෙස අවබෝධ කර ගනිති.

2. රජයන් හා ජාත්‍යන්තර සමථකරුවන් තමන්ගේ රාජකාරිය ඉටු නොකරති. සාම ක්‍රියාවලීන්වල හෝ රජයන් වල හෝ සමථකරුවන්ගේ සම්මත ක්‍රියාකාරී පිළිවෙතේ කාන්තාවන්ගේ හඬවල් ඇතුළත් කරගැනීම කොටසක් වශයෙන් නොපවතී.

3. කාන්තාවන්ගේ සහභාගිත්වයට සහාය වෙන මැදිහත්වීම් තවමත් අහඹු ආකාරයෙන් සිදුවේ. ක්‍රමානුකූලව සිදු නොවේ.

4. අරමුදල් සපයන අය තමන් දේශනා කරන දෙය ක්‍රියාත්මක නොකරති. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාව 1325 පිළිබඳ ඔවුන්ගේ ප්‍රතිපත්තීනන් හා ක්‍රියාකාරකම්, ආධාර වැඩසටහන් හා ගැටුම් තත්ත්වයන් තුළ රාජතාන්ත්‍රික මැදිහත්වීම් අතර සම්බන්ධයක් නොපවති.

5. සාකච්ඡාවලට ඇතුල් කිරීම සඳහා තවමත් ‘ ඔබ කවුද? ඔබට හමුදාවක් තිබේද?’ යන නිර්ණායකය භාවිතා කරනු ලැබේ.

කාන්තාවන් ඉහළ මට්ටමේ සාකච්ඡාවල පළපුරුද්දක් ලබා සිටින වැදගත් නායිකාවන් වශයෙන් හා විශාල කණ්ඩායමකගේ සහයෝගයෙන් යුතුව බිම් මට්ටමේ ක්‍රියාධරයන් වශයෙන් සිටින අවස්ථාවල පමණක් සහභාගිවීමට ඔවුන් සුදුසුකම් ලබති. එවැනි අවස්ථාවල වුවත් සහ ඇතුළත් කරගැනීම සඳහා, තහවුරුවක් නොමැත. සන්නද්ධ කණ්ඩායම්වලට සම්බන්ධ ක්‍රියාධරයන්ට තිබෙන සුදුසුකම ප්‍රචණ්ඩත්වය මුදාහැරීමේ ඔවුන්ගේ හැකියාව වේ.

6. සාම සාකච්ඡා සියලුම දේවල් ඇතුළත් වූ සාමයක් බලාපොරොත්තු නොවේ. එය වෙනුවට එම සාකච්ඡා සටන් විරාම, දේශපාලන කටයුතු හා ගැටුම් කළමනාකරණය වැනි දේශපාලන ඉහළ පැලැන්තියට ගැලපෙන දේවල් පිළිබඳ අවධානය යොමු කරයි.

7. බොහෝ රජයන් හා ජාත්‍යන්තර ක්‍රියාධරයන් කාන්තාවන්ගේ ප්‍රශ්න පිළිබඳ කටින් පමණක් දායකත්වයක් ලබාදෙති. නමුත් එම කාන්තාවන් ප්‍රධාන ධාරාවේ මැදිහත් වීම සඳහා ඔවුන් සහයෝගය ලබා දෙන්නේ නැත.

8. කාන්තාවන්ගේ ධාරිතාව ගොඩනැගීම සාමය හා ආරක්ෂාව පිළිබඳ ගැටලුවලට සෘජුවම සම්බන්ධ නොවේ. පුහුණුවක් ලබාදෙන අවස්ථාවක වුවද පාලනය හා බලය බෙදා ගැනීම වැනි වහා විසඳිය යුතු ප්‍රධාන ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා ඔවුන් කාන්තාවන් ප්‍රමාණවත් ආකාරයෙන් සූදානම් නොකරති.

## සාම ක්‍රියාවලිය ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලියක් ලෙස පත්කර ගන්නේ කෙසේද යන ප්‍රශ්නය ආමන්ත්‍රණය කිරීම.

සමථකරණ හා ගැටුම් විසඳීසෙම් පරිචයන් සැලකිය යුතු ප්‍රමාණයකින් වර්ධනය වී ඇති අතර, ඉහළ මට්ටම්වල ඇතුළත් කර ගැනීම පිළිබඳව අවබෝධයද වැඩිවී තිබේ. නමුත් බොහෝ විධිමත් සාම සාකච්ඡා ක්‍රියාවලීන්වල කාන්තාවන් ඇතුළත් කර ගැනීම සඳහා වූ විරෝධයක් හා එය පිළිබඳව අනවබෝධයක් තවමත් පවතී. සාමය ගොඩනගන බොහෝ කාන්තාවන්ට තමන්ගේ රටවල්වල අනාගතය තීරණය කරන සාම සාකච්ඡාවලට සහභාගිවීමට අවස්ථාවක් ලැබෙන්නේ නැත. සමථකරුවන් හා තෙවන පාර්ශ්වයේ සාකච්ඡාකරුවන් අතර දේශපාලන කැමැත්තක් නොමැතිවීම, ඔවුන්ගේ නීත්‍යානුකූලභාවය හා විශේෂඥදැනුම පිළිබඳ ප්‍රශ්න පැවතීම හෝ ඒ ඒ අවස්ථාවන්වල පිළිපදින පරිචයන් වැනි බාධක වලට ඔවුන් මුහුණ දෙති.

මෙම තත්ත්වය අවබෝධ කර ගෙන සිටින ජාත්‍යන්තර සිවිල් සමාජ ක්‍රියාකාරී ජාලය (ICAN) හා එහි හවුල්කාර සංවිධාන 2014 ජූනි මාසයේ ' වඩා හොඳ සාමයක් සඳහා සාකච්ඡා

කිරීම් යන මැයෙන් වූ සමුළුව සංවිධානය කළ අතර, එම සමුළුවේ සිවිල් සමාජ සංවිධාන, රජයන් හා ජාත්‍යන්තර සංවිධාන සහභාගී විය. කාන්තාවන් ඇතුළත් කර ගන්නේ ඇයි යන ප්‍රශ්නයෙන් ඔබ්බට ගිය මෙම සමුළුව එය දැනට සිදු කෙරෙන්නේ කෙසේද යන ප්‍රශ්නය මතු කළේය. ඇතුළත් කර ගැනීම මුහුණ දෙන අභියෝග පිළිබඳ මෙම සමුළුවේ සහභාගීවූ අය සාකච්ඡා කළ අතර, ඒවා සඳහා වූ ලබා ගත හැකි විසඳුම් පිළිබඳවද සාකච්ඡා කළහ.

වඩා හොඳ සාම උත්සාහය සඳහා ඉන් පසුව පවත්වන ලද සම්මන්ත්‍රණ, කලාපීය සාකච්ඡා හා සම්මුඛ සාකච්ඡා පදනම් කර ගෙන වඩා හොඳ සාම මෙවලම එහි II වන කොටසෙහි කාන්තාවන් ඇතුළත් කර ගැනීම සඳහා පවතින පොදු බාධක 6 ක් (අංශය 1) ආමන්ත්‍රණය කරන අතර, සමථකරණය හා සාමය ඇති කිරීමේ ක්‍රියාවලීන්වල සාමය ගොඩනගන කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂ සමාජභාව දෘෂ්ටි කෝණයන් වඩාත් ව්‍යුහාත්මක ආකාරයට හා ක්‍රමානුකූලව ඇතුළත් කර ගැනීම සඳහා වූ සරල, නමුත් විස්තරාත්මක රාමුවක් ඉදිරිපත් කරයි (අංශය 2)

## " සාමය ගොඩනගන කාන්තාවන් " කවුරුන්ද?

'' සාමය ගොඩනගන කාන්තාවන් , යන වචනය අවිහිංසාවාදයට කැපවී සිටින තනි පුද්ගලයන් හා කාන්තා මූලික සංවිධාන සඳහන් කරයි. ඔවුන් සාම සාකච්ඡාවලට පක්ෂව සිටින අතර මානව හිමිකම් හා කාන්තා හිමිකම්වලට සහයෝගය ලබා දෙති. සමහර අය යුක්තිය වෙනුවෙන් පෙනී සිටින අතර, අනෙක් අය ගැටුමේ බලපෑම් ආමන්ත්‍රණය කිරීම සඳහා හා/හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාව දෘෂ්ඨී කෝණයෙන් යුතුව සාමය ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කරති. සාමාන්‍යයෙන් පළමුවෙන්ම සාමය වෙනුවෙන් හඬ නගන කණ්ඩායම මොවුන් වුනත්, තවමත් ඔවුන් කොන්වී සිටිති (සිවිල් සමාජ සංවිධාන හඳුනා ගැනීම සඳහා වූ නියැදි නිර්ණායකය පිටු, 41-42, කොටුව 3 බලන්න).

# කොටස II
# වඩා හොඳ සාම මෙවලමත ඇතුළත් කර ගැනීමේ සාම ක්‍රියාවලීන් හා සාකච්ඡා සඳහා වූ මඟ පෙන්වීමක්.

සමථකරණ ක්‍රියාවලියේ සාමය ගොඩනගන කාන්තාවන් සම්බන්ධ කර, ඔවුන් ඇතුළත් කර ගැනීම පිළිබඳ බොහෝ පූර්වාදර්ශයන් තිබේ. අවාසනාවකට මෙන් මෙම ක්‍රියාකාරකම් බොහෝ අවස්ථාවල ක්‍රමානුකූලව සිදු නොවේ. අරමුදල් ලැබුනත් අනිකුත් සංවිධාන කටයුතු පිළිබඳ සහයෝගය ඔවුන් වෙත ලැබෙන්නේ නැත හෝ කාන්තාවන් ඇතුළත් කර ගැනීම සඳහා වචනවලින් පමණක් බොහෝ අය සහයෝගය ලබා දෙති. නමුත් තාක්ෂණික හෝ මුල්‍ය ආධාර මගින් එය සිදු නොවේ. බොහෝ අවස්ථාවල සාම ක්‍රියාධරයන් සිතියම් ගත කිරීම හා 'සාමය' යන සංකල්පය ආමන්ත්‍රණය කිරීම යන මට්ටම්වල කාන්තාවන් සහභාගි නොවෙති. වඩා හොඳ සාම මෙවලම ඒ ඒ අවස්ථාවල පිළිපදින පරිචයන් ඉවත් කර ගැනීමටත්, සාම ක්‍රියාවලීන්වල සෑම අදියරකම ක්‍රමානුකූල හා සියලු දේවල් ඇතුළත් ප්‍රවේශයක් දිරි ගැන්වීමටත් සාමය ඇති කිරීම හා සමථකරණ භාවිතය වැඩි දියුණු කිරීමටත් සරල රාමුවක් ලබා දෙයි.

## වඩා හොඳ සාම මෙවලම කියන්නේ මොනවාද ?

වඩා හොඳ සාම මෙවලම විවෘත මූලාශ්‍රයක් වන අතර, ක්‍රමානුකූලව හා ව්‍යුහාත්මකව පහත සඳහන් අය හා දේවල් ඇතුළත් කර ගැනීම අවධාරණය කරන සමථකරණ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට උපකාරී වන මඟ පෙන්වීමක් වේ.

- අවිහිංසාවාදී හා සාමයට ළැදි හා සමානාත්මතාවයට ගරු කරන සිවිල් සමාජ සංවිධාන- විශේෂයෙන් සාමය ගොඩනගන කාන්තාවන්
- සාම සාකච්ඡාවේ වැදගත් ගැටලු පිළිබඳ ස්ත්‍රී - පුරුෂ සමාජභාව දෘෂ්ඨී කෝණයන්

'එක ප්‍රමාණයක් සියලු දෙනාටම ගැළපෙන' ප්‍රවේශයක් නොමැත. ඒ වෙනුවට සාර්ථක ක්‍රියාවලියක් තහවුරු කර ගැනීම සඳහා එක් එක් පසුබිම් වෙනුවෙන් පිළිපැදිය යුතු අවශ්‍ය කරුණු මෙම මෙවලම පෙන්වා දෙයි.

## මෙම මෙවලම කවුරුන් සඳහාද?

මෙම මෙවලම ප්‍රාථමික වශයෙන් බහු පාර්ශවීය සංවිධාන, ජාතික හා ජාත්‍යන්තර රාජ්‍ය

නොවන සංවිධාන, සාකච්ඡා කරන පාර්ශ්වයන් ඇතුළත් තෙවෙනි පාර්ශ්වයේ රජයන් වෙනුවෙන් සංවර්ධනය කර ඇත. එම පාර්ශ්වයන් පහත සඳහන් කරුණු කෙරෙහි කැපවී සිටිති.

1. ගැටුමක් හෝ අර්බුදයක් පිළිබඳ සමථකරණයේ යෙදීම.

2. සහයෝගය ලබාදීම, අරමුදල් ලබාදීම හෝ සමථකරණය තහවුරු කිරීම.

3. ගැටුම තිරසාර ලෙස විසඳීම සඳහා දායකත්වය ලබාදීම හා අලුත් හෝ දැඩි ප්‍රචණ්ඩත්වයට මඟ පෑදිය හැකි ක්‍රියාවලිය අසාර්ථක වීමේ අවධානම අවම කරයි.

4. ආරවුල් සාමකාමීව සමථයට පත් කිරීමේ UNGA යෝජනාව ක්‍රියාත්මක කිරීම.

5. කාන්තාවන් සාමය හා ආරක්ෂාව පිළිබඳ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම (එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාව 1325 හා අදාළ යෝජනා) හා

6. සාම ක්‍රියාවලීන්වල හා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1325 ක්‍රියාත්මක

කිරීමේදී සිවිල් සමාජ කණ්ඩායම් ඇතුළත් කර ගැනීම සඳහා හඬ නැගීම හා/හෝ එය අධීක්ෂණය කිරීම.

## ඇතුළත් කර ගැනීම වැදගත් වන්නේ ඇයි ?

සිවිල් සමාජ සංවිධාන ඇතුළත් කර ගැනීම සාම ක්‍රියාවලීන්වල නිත්‍යානුකූලභාවයට හා තිරසාරභාවයට පහත සඳහන් ආකාරයෙන් දායකත්වයක් ලබා දෙයි.

- එම ක්‍රියාවලිය පිළිබඳ මහජන පිළිගැනීම හා ජාතික අයිතිය වැඩිදියුණු වීම හා බැහැර කරන ලද කණ්ඩායම් මෙම ක්‍රියාවලිය කඩා කප්පල් කිරීමට දරන උත්සාහයන් අවම කිරීම.

- ගැටුමේ යෙදී සිටින සාකච්ඡා කරන පාර්ශ්වයන් තමන්ගේ සමාජවල අනාගතයන් පිළිබඳ බලය හා වගකීම නිසි ලෙස, බෙදා ගැනීමට හැකිවීම.

- ප්‍රචණ්ඩත්වය අවසන් කර ගැටුම් සාමකාමීව විසඳා ගැනීම සඳහා ගැටුමේ පාර්ශ්වයන් අතර වැඩි දේශපාලන කැමැත්තක් දිරි ගැන්වීම.

- දැඩි මානුෂීය හා මිනිස් ආරක්ෂාව පිළිබඳ ගැටලු ආමන්ත්‍රණය කිරීම.
- ප්‍රශ්න විසඳා ගැනීම සඳහා විකල්ප අවස්ථාවන් ලබාදීම.
- සාමය පිළිබඳ සංකල්ප හා පරිචයන් පිළිබඳ අපගේ සාමූහික අවබෝධය වැඩි දියුණු කිරීම හා සාමය ගොඩනගන අයගේ මෙම ඥානය ඇතුළත් කර ගැනීම හා එළඹ ගත් ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා වූ කැපවීම වැඩි දියුණු කිරීම.

## අංශය 1
## පොදු බාධක හා නවෝත්පාදන විසඳුම්: සාමය ගොඩනැගීමේදී සියළු දෙනාම ඇතුළත් කරගැනීම සඳහා වූ නව පූර්වාදර්ශයන්

### සමාජ පරිවර්ථන මෙවලම් වශයෙන් සාම ක්‍රියාවලීන්

සාමය සහ දේශපාලන පරිවර්ථන ක්‍රියාවලියන් ප්‍රචණ්ඩත්වය අවසන් කර, සන්නද්ධ ගැටුම් විසඳීම කෙරෙහි දීර්ඝ කාලයක් අවධානය යොමු කර ඇත. කෙසේවෙතත්, මෙම ක්‍රියාවලීන් ගැටුමකින් හෝ අර්බුදයකින් පීඩාවකට පත්වී තිබෙන රාජ්‍යයන් පරිවර්ථනය වීම සඳහා අත්‍යවශ්‍ය අවස්ථාවන්ද ලබාදෙයි. ඒවා නව ආයතන, ව්‍යවස්ථා සංශෝධනය, යාවත්කාලීන කරන ලද අධිකරණ පද්ධතීන්, නව බල ව්‍යුහයන් හා ගැටුමට පාදක වූ මූලික හේතු සහ එහි ප්‍රතිවිපාකයන් ආමන්ත්‍රණය කරන ආකාරයේ සමාජය තුළ නව සබඳතා ගොඩනැගීම වැනි දේවල්වට මඟ පෑදිය යුතුය. සහභාගීවීමට අවස්ථාව ලබාදිය යුතු ලෙස ලෝකය පුරාම පුරවැසි සංවිධාන පාලනයේදී වැඩි වශයෙන් ඉල්ලීම් කරමින් සිටින අවස්ථාවක සාම ක්‍රියාවලීන්වල කෙටිකාලීන අරමුණුවලින් -

ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම වැනි අරමුණුවලින්- ඔබ්බට ගොස් තිරසාර සාමය හා සමාජ විපර්වර්ථනය වැනි දීර්ඝ කාලීන අරමුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු බව ඉල්ලීමක් තිබේ.

" කාන්තාවන් සාකච්ඡා මේසයේදී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා ජනවාර්ගික ගැටළු "

මතුකරන අතර, ඔවුන් පාලනය හා සමාජ ප්‍රශ්ණ කෙරෙහිද අවධානය යොමු කරති. එම නිසා සාම සාකච්ඡාවල කාන්තාවන්ගේ සහභාගිත්වය අපට අවශ්‍ය වේ. ඒ කාන්තාවන්, සාකච්ඡාකරුවන් හා ක්‍රියාත්මකකරන්නන් අවංකාභාවයේ තබා ගනිති.

**තානාපති ඩොන් ස්ටීන් බර්ග්**

World Learning සංවිධානයේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී, එක්සත් ඇමරිකා ජනපදයේ හිටපු අංගෝලාව සඳහා වූ තානාපති.

සාම ක්‍රියාවලීන්වල සාමය ගොඩනගන කාන්තාවන් ඇතුළත් කරගැනීම සාමය ගොඩනැගීම කෙරෙහි පරිවර්ථන ප්‍රවේශය කරා

යොමුවීමට තිබෙන ඉතා වැදගත් පියවරයක් වේ. නමුත් අප පහත සඳහන් කරන බාධක නිසා එය තවමත් යථාර්ථයක් වී නොමැත. 'වඩා හොඳ සාම මෙවලම් ඇතුළත් කරගැනීම සඳහා තිබෙන පහත සඳහන් බාධක හය ඉවත් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරයි.

**බාධක එක :** '' අප සියළු දෙනාම නියෝජනය කරමු'', ගැටුමක පාර්ශ්වකරුවන් කාන්තාවන් සාකච්ඡා මේසයට පිළිනොගනිති.

**බාධක දෙක :** '' සමථකරුවාට සියළු දේවල් කළ නොහැකිය'' , හෝ කාන්තාවන් ඇතුළත් කරගැනීම ප්‍රමුඛතාවයක් ලෙස නොසලකයි.

**බාධක තුන :** '' කවුද මේ කාන්තාවන් ?'' සාමය ගොඩනඟන කාන්තාවන්ගේ නීත්‍යානුකූලභාවය පිළිබඳ ප්‍රශ්න නගති.

**බාධක හතර:** '' මය කාන්තාවන් පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. හමුදා හා ආරක්ෂා පිළිබඳ ගැටළු ''තාක්ෂණික , ස්වභාවයේ ගැටලු වන අතර ඒවා සිවිල් සමාජයට ''අදාළ නොවේ''

**බාධක පහ :** “ මම මාගේම සුදුසුකම් නිසා මෙම ස්ථානයේ සිටිමි”. කාන්තා නියෝජිතවරියන් “අප කාන්තාවන් නියෝජනය කරන්නේ නැත” යැයි කියන විට.

**බාධක හය:** “කාන්තාවන් බැහැර කිරීම සංස්කෘතික දෙයකි”, තවද සාම සාකච්ඡා පවත්වන මේසය ස්ත්‍රී-පුරුෂ සමාජභාව සමානතාවය පිළිබඳ සලකන ස්ථානයක් නොවේ.

සාමය ගොඩනැගීමේ සෑම ක්‍රියාවලියකදීම මෙම බාධකයන් මතුවේ.



## "අප සියළුදෙනාම බාධක එක නියෝජනය කරමු." ගැටුමක සම්බන්ධ පාර්ශ්වයන් කාන්තාවන් සාම සාකච්ඡා මේසයට පිළිනොගනිති.

ගැටුමක පාර්ශ්වකරුවන් විශේෂයෙන් වැඩිහිටියන්, ආගමික නායකයින් වැනි සිවිල් සමාජ ක්‍රියාධරයන් සමඟ විවෘතව කටයුතු කිරීමට කැමැත්තක් දක්වන බව පර්යේෂණ හා අත්දැකීම් පෙන්වා දෙයි. නමුත් කාන්තාවන් පිළිබඳ ප්‍රශ්නයේදී බොහෝ පසුබිම්වල මෙම අය අකැමැත්තක් දක්වයි. කාන්තාවන් බැහැර කිරීම 'සංස්කෘතික' කරුණක් ලෙස එම පාර්ශ්වකරුවන් කිව හැකිය. නමුත්, මෙය ලෝකය පුරාම සිදුවන දෙයක් බවත්, බොහෝ අවස්ථාවල ලිංගිකත්වය පිළිබඳ ප්‍රතිමානයන් පදනම් කරගෙන සිදුවන දෙයක් බවත් දත්ත පෙන්වා දෙයි. කාන්තාවන් බැහැර කිරීමට ඉදිරිපත් කරන හේතු ඔවුන් සුදුසුකම් ලබා නැත. යන හේතුවේ සිට " ඔවුන් ගමන් කිරීම ආරක්ෂාකාරී නොවෙ", වැනි හේතු දක්වා කියනු ලැබ්. කාන්තාවන් යුධ කලාපවල ජීවත්වන අවස්ථාවල පවා මෙසේ කියනු ලැබේ.

## මෙම බාධක ජය ගන්නේ කෙසේද? :

1. කාන්තාවන් ඇතුළත් කරගැනීම ගැටුමට සම්බන්ධ පාර්ශ්වයන්ට ඵලදායි බව පෙන්වා දෙන්න. එයට හේතුව (අ) තමන්ගේ කණ්ඩායමේ සිටින සෑම දෙනා කෙරෙහිම අවධානය යොමු කිරීම තුළින් එය ඔවුන්ට නිත්‍යානුකූල බවක් ලබාදෙයි. (ආ) එය සාකච්ඡාවල සාරය පෝෂණය කරන අතර, සාමාන්‍ය ජනතාවට බලපාන ගැටළු පිළිබඳව ඔවුන්ගේ අවබෝධය වැඩිදියුණු කරයි.

2. තාක්ෂණික නිපුණතාවයන් තිබෙන කාන්තාවන් හා සාමය ගොඩනඟන කාන්තාවන් සමඟ දැඩි සම්බන්ධතා පවත්වන කාන්තාවන් මෙයට පත්කිරීම සඳහා එය පාර්ශ්වයන් දිරි ගන්වයි.

3. න්‍යාය පත්‍රයේ තිබෙන මාතෘකා පිළිබඳ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට අදාළ නිරීක්ෂණ පත්‍රිකා ලබාදෙයි. එවිට යුද්ධය නිසා කාන්තාවන් හා පිරිමින් පීඩාවට පත් වන ආකාරය පිළිබඳවද,ඒවාට ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳව නියෝජිතයින්ට අවබෝධ කර ගතහැකිය.

4. කාන්තා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් හෝ රජයේ අනෙකුත් ව්‍යුහයන් තුළ සිටින කාන්තාවන් ඇතුළත් කර ගැනීම දිරි ගන්වයි.

5. වැඩි වශයෙන් කාන්තාවන් ඇතුළත් කරගන්නා පාර්ශවයන්ට අමතර ආසන වැනි ධනාත්මක දිරිගැන්වීම් ලබාදීම.

6. කාන්තාවන් සඳහා අවම පංගුවක් ස්ථාපිත කිරිම. කාන්තාවන් පත් නොකරන්නේ නම් මෙම ආසන හිස්ව පවතී.

7. තමන්ගේ ප්‍රජාවට බලපාන ගැටලු හා තමන් කරන සාම ක්‍රියාකාරකම් ඉස්මතු කිරීම සඳහා සාමය ගොඩනගන කාන්තාවන්ට ගැටුම් පාර්ශ්වයන් සමඟ සම්බන්ධ විමට අවස්ථාවක් ලබා දෙයි.

8. දූත පිරිස්වලට කාන්තාවන් ඇතුළත් කර තිබෙන අවස්ථාවල, තාක්‍ෂණික සහාය ලබාදීම සඳහා හා ඔවුන් සාමය ගොඩනගන කාන්තාවන් සමඟ සම්බන්ධ කිරීම සඳහා ඔවුන් සමඟ වෙනම සාකච්ඡා පැවැත්විය යුතුය.

9. සමථකරුවන්ට හා ඔවුන්ගේ කණ්ඩායම් වලට තොරතුරු ලබාදී, උපදෙස් ලබාදීම සඳහා

ප්‍රාදේශීය කාන්තා නායිකාවන්ගෙන් සමන්විත ස්ත්‍රී-පුරුෂ සමාජභාව විශේෂඥ සහයෝගිතා කණ්ඩායම් ස්ථාපිත කිරීමට තානාපතිවරුන්ට දිරි ගැන්වීමක් ලබාදෙයි.

**කොලොම්බියාවේ රජයේ පාර්ශ්වයට කාන්තාවන් දෙදෙනෙක් පත්කරන ලදි. ඔවුන්ගේ තාක්ෂණික නිපුණතාවය හා දැනුම පදනම් කරගෙන මෙය සිදුකරන ලදි. ඒවාගේම ඔවුන් සාමය ගොඩනඟන කාන්තාවන් සමඟ සාකච්ඡා කිරීමට විවෘතව ඉදිරිපත් වූහ. කොලොම්බියානු සාම සාකච්ඡා ක්‍රියාවලිය මුළුල්ලේම මඟ I හා මඟ II ක්‍රියාවලීන් අතර සබඳතා, කාන්තාවන්ගේ බලපෑම සාම සාකච්ඡා මේසයෙන් ඔබ්බටද දිරිගැන් විය. උදා: වශයෙන් 2013 වසරේදී කාන්තාවන් හා සාමය යන සමුළුවට කාන්තාවන් 449 දෙනෙක් කැඳවන ලද අතර, සාම ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා 6 ක් එම සමුළුවේදී පිළියෙල කරන ලදී. පසුව මෙම යෝජනා සාකච්ඡා කරන කණ්ඩායම් වලට ඉදිරිපත් කරන ලදි.**

## බාධක හය:
## ‘‘ සමථකරුවාට සියලු දේවල් කළ නොහැකිය’’ හෝ කාන්තාවන් ඇතුළත් කරගැනීම ප්‍රමුඛතාවයක් ලෙස නොසලකයි.

ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමේ හදිසි අවශ්‍යතාවය තුළ සමථකරණයේ මුල් අදියරවලදී කාන්තාවන් සෘජුව සම්බන්ධ නොවන බව සමථකරුවන් බොහෝ අවස්ථාවල අනුමාන කරති. කාන්තාවන් මෙයට සම්බන්ධ කරගැනීම සියුම් ක්‍රියාවලිය තවත් සංකීර්ණ කළ හැකි යැයි සමහරු සිතති. එසේ නැත්නම්, සාකච්ඡා මේසයට එය ‘‘වැඩි බරක්, වන බවද, අසාර්ථක වීමේ අවදානම වැඩි කළ හැකි බවද ඔවුන් සිතති. කාන්තාවන් ඇතුළත් කරගැනීමට ඔවුන් කැමැත්තක් දක්වන අවස්ථාවල වුවත්, ‘ සමථකරුවා දෙවියෙක් නොවේ’ සැමවිටම කාන්තාවන් ඇතුළත් කරගන්නා ලෙස පාර්ශ්වකරුවන් පෙළඹ විය නොහැකිය යන ආකාරයෙන් ප්‍රතිචාර දක්වනු ලැබේ. නමුත්, ඇතුළත් කරගැනීම ඉතා වටිනා අරමුණක් බව පර්යේෂණ පෙන්වා දෙයි. බොහෝ අවස්ථාවල සටන් විරාමයක් සාර්ථක කර ගැනීමෙහිලා සාකච්ඡාව ඉදිරියට රැගෙන යෑමට වාතාවරණයක් නිර්මාණය කිරීමේ කාර්යයේ කාන්තාවන් වැදගත් කාර්යභාරයන් ඉටුකර ඇත.

## මෙම බාධකය ජය ගන්නේ කෙසේද? :

1. දූතයෙකු හෝ සමථකරුවෙකු පත්කරන අවස්ථාවක, ආරක්ෂක මණ්ඩල යෝජනාව 1325 ක්‍රියාත්මක කිරීම එම න්‍යායපත්‍රයට ඇතුළත් කරගැනීම තහවුරු කර ගන්න.

2. කාන්තාවන් ඇතුළත් කරගැනීම කෙරෙහි කැපවීමෙන් කටයුතු කරන (උදා: වශයෙන් කාන්තාවන්, සාමය හා ආරක්ෂාව පිළිබඳ කාන්තාවන්ගේ මිත්‍ර කණ්ඩායම් වැනි) තුන්වෙනි පාර්ශ්වයේ ක්‍රියාධරයන් හා සම්බන්ධවන්න. පහත සඳහන් දේවල් සඳහා සහයෝගය පතන්න.

   - සමථකරුවා සමඟ අවිධිමත් ආකාරයට ඇතුළත්කරණය පිළිබඳ කරුණු මතු කරන්න. ඒ පිළිබඳ තිබෙන ප්‍රතිමාණික බැඳීම් සාර්ථකත්වය කෙරෙහි කාන්තාවන්ගේ ධනාත්මක බලපෑම්, ඒවාගේම අනෙකුත් ස්ථානවල සමථකරණ ක්‍රියාවලීන්වල යෙදීමෙන් කාන්තාවන් ලබා ගන්නා ලද අත්දැකීම් යන කරුණුද සඳහන් කරන්න.

- සාමය ගොඩනගන කාන්තාවන්ගේ හා රාජ්‍යතන්ත්‍රික දූතයන් අතර රැස්වීම් පැවැත්වීමට පහසුකම් සලසන්න. ක්‍රියාවලියේ මුල්දී පටන් ක්‍රමානුකූලව සබඳතා ඇතිවීමට එය දිරිගැන්විය හැකිය.

- කාන්තා කණ්ඩායම් සමග ඇති කරන ලද සබඳතා පිළිබඳ වාර්තා කරන ලෙස දූතයාගෙන් ඉල්ලීමක් කරන්න.

- සමථකරණ කණ්ඩායම මුල සිටම පළපුරුදු ස්ත්‍රී-පුරුෂ සමාජභාව/ඇතුළත් කරගැනීමේ උපදේශකවරයෙක් (Gender/Inlusion Advisor) ඇතුළත් කරගැනීම තහවුරු කරන්න. අරමුදල් ලබාදීම හා මෙම පත්වීම නිරීක්ෂණය කිරීම තුළින් මෙය කළ හැකිය.

3. අතීතයේදී කාන්තාවන් සමග සාකච්ඡා පවත්වා ඇති දූත පිරිස් සම්බන්ධ වී ඇති ආකාරය මතක් කර දී, ඇතුළත් කරගැනීමේ ක්‍රියාවලිය සාර්ථක වූ ආකාරය පිළිබඳව ආදර්ශයන් ලබා දෙන්න

4. මෙම ක්‍රියාවලීන්වල සාමය ගොඩනගන කාන්තාවන් ඇතුළත් කරගැනීමෙන්

ලබාගෙන ඇති ප්‍රතිලාභ හා ධනාත්මක අත්දැකීම් පිළිබඳ අනෙකුත් සමථකරුවන්ට හා දූතයන්ට උදාහරණ හා උදෘතයන් ලබා දෙන්න.

5. විවිධ මාතෘකා පිළිබඳව දැනට තිබෙන ගිවිසුම්වල ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන වචනයඇතුළත් කර තිබෙන ආකාරය පිළිබඳ නියැදියන් ලබා දෙන්න.

6. කාන්තාවන්, සාමය හා ආරක්ෂාව පිළිබඳ නිපුණතාවය ලබාගෙන ඇති ජාත්‍යන්තර සංවිධාන සමඟ සාකච්ඡා කර, ඔවුන් වෙත උපරිම ආකාරයෙන් සහයෝගය ලබා දෙන්නේ කෙසේ දැයි ප්‍රාදේශීය සාමය ගොඩනගන කාන්තාවන් සමඟ සාකච්ඡා කරන්න.

2014 වසරේදී එක්සත් ජාතීන්ගේ විශේෂ දූතවරිය වන මේරි රොබින්සන් සාමය, ආරක්ෂාව හා සහයෝගීතාවය රාමුව සඳහා වූ Great Lakes Womens's Platform යන වැඩසටහන දියත් කළාය. කොන්ගෝ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ හා එම කලාපයේ සාම ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී කාන්තාවන්ගේ කාර්යභාරයන් ප්‍රවර්ධනය කිරීම සඳහා එය දියත් කරන ලදි. මෙම වැඩසටහන සාමය ගොඩනගන කාන්තාවන්ට අරමුදල් ලබාදෙන අතර, (තමන්ගේ සාමාජිකත්වයෙන් වැඩි වශයෙන් කාන්තාවන් බැහැර කර සිටින) ජාතික හා කලාපීය ක්‍රියාත්මක කිරීමේ කමිටුවලට සම්බන්ධ වීමට කාන්තාවන්ට අවස්ථාව ලබා දෙයි.

## බාධක තුන:
## " කොහොම වුනත් මේ කාන්තාවන් කවුද? "
## සාමය ගොඩනගන කාන්තාවන්ගේ නීත්‍යානුකූලභාවය පිළිබඳ ප්‍රශ්න නැගීම

කණ්ඩායමක හෝ තනි පුද්ගලයන්ගේ නීත්‍යානුකූලභාවය පිළිබඳ ප්‍රශ්න කිරීම, සමථකරණ ක්‍රියාවලියෙන් ඔවුන් බැහැර කිරීම සඳහා පාවිච්චි කරන නිශ්චිත ක්‍රමයක් වේ. කාන්තාවන් ඇතුළත් කරගැනීම පිළිබඳ බොහෝ අවස්ථාවල මෙම "නීත්‍යානුකූලභාවය, ප්‍රශ්නය නගනු ලැබේ. කාන්තාවන් "බොහෝ දුරට බිම් මට්ටමේ අය, ලෙස හෝ "බොහෝ ඉහළ පැලැන්තියේ අය, ලෙස සඳහන් කරනු ලැබේ. එමනිසා සාම සාකච්ඡාවල සහභාගිවීමට ඔවුන්ට සුදුසුකම් හා විශ්වසනීයත්වයක් නැති බව සඳහන් කරනු ලැබේ. ඒවාගේම ආගමික නායකයන් හෝ වැඩිහිටියන් වැනි අනෙකුත් සිවිල් සමාජ කණ්ඩායම් මෙම සුදුසුකම් පිළිබඳ බාධකවලින් තොරව සාකච්ඡාවලට ඇතුළත් කරගනු ලැබේ.

කෙසේවෙතත්, අවි සතුව ප්‍රචණ්ඩත්වය මුදා හරින කණ්ඩායම්වල නිතත්‍යානුකූලභාවය පිළිබඳ ප්‍රශ්න මතු කරන්නේ ඉතා කලාතුරකිනි. හේතුව බලය පාවිච්චි කිරීම හරහා ඔවුන්ට එම

ක්‍රියාවලිය කඩාකප්පල් කිරීමේ හැකියාව තිබීමයි. එමනිසා කිසිම ප්‍රශ්නයකින් තොරව මෙම ක්‍රියාවලියේ සහභාගි වන ලෙස ඔවුන්ට සැමවිටම ආරාධනා කරනු ලැබේ. මෙම දෙබිඩි පිළිවෙත ගැටුම් නිර්මාණය පුද්ගලයන්ට සාකච්ඡා මේසයේ ආසනයක් ලබාදීම මගින් ප්‍රචණ්ඩත්වය දිරි ගැන්වීමේ අවධානම ඇති කරයි. ඒවාගේම අවිහිංසාවාදී ලෙස ගැටුම් විසඳීම සඳහා කැපවීමෙන් කටයුතු කරන සාමය ගොඩනගන කාන්තාවන් හා අනෙකුත් සිවිල් සමාජ ක්‍රියාධරයන් සැලකිල්ලට නොගැනේ.



## මෙම බාධකය ජය ගන්නේ කෙසේද ? :

1. ගැටුම් අවස්ථාවලදී සාමය ඇති කිරීම සඳහා කාන්තාවන් ලබාදී ඇති නායකත්වයේ ඉතිහාසය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, ඔවුන්ගේ අතීත සජීවීකරණය හා ලබා ගත් ප්‍රතිලාභ හා සාමය ඇති කිරීම,සඳහා සමථකරණය හා සටන් විරාම සාකච්ඡා වල ඔවුන්ගේ ක්‍රියාකාරකම් හා සමාජ හා සංස්කෘතික වෙනස්වීම් පිළිබඳ ආකෘති.

2. සාම සාකච්ඡා මේසයට සහභාගි වන පිරිමින් ගැන සිතා බලා, ඔවුන්ගේ සුදුසුකම් පිළිබඳ ප්‍රශ්න නැගීම මගින් " කාන්තාවන් ඉහළ

පැලැන්තියේ අය, හෝ ' වැඩි වශයෙන් බිම් මට්ටමට සම්බන්ධ අය, බව කරන තර්ක ප්‍රතික්ෂේප කිරීම.

3. මූලික අගයන්, හැකියාවන් හා අදාළ පාර්ශ්වයන් පදනම් කරගෙන සිවිල් සමාජ කණ්ඩායම් ඇතුළත් කර ගැනීම සඳහා වූ නිර්ණායකයක් සහිතව 'ප්‍රමාණවත් ලෙස ඇතුළත් කරගැනීමේ ' ක්‍රියාවලියක් සඳහා වූ සූත්‍රයක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීම (සිවිල් සමාජය හඳුනාගැනීම සඳහා වූ නියැදි නිර්ණායකය පිළිබඳ කොටු තුන බලන්න).

4. ක්‍රියාවලිය සඳහා පොදු ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීම සඳහා මහජන සාකච්ඡා පැවැත්වීමට කාන්තාවන් ගන්නා උත්සාහයන්ට ආධාර කිරීම හා ඔවුන්ගේ නියෝජනය සඳහා නිළවරණ හෝ තෝරා ගැනීමේ ක්‍රියාවලීන් පිළිබඳ එකඟතාවයන්ට පැමිණීම.

සිරියාවේ ප්‍රාදේශීය සටන් විරාම සාකච්ඡාවලදී කාන්තාවන් ප්‍රබල කාර්යභාරයක් ඉටුකළ නමුත්, 2014 වසර මුලදී ජිනිවාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත්වීමෙන් පවත්වන ලද සාම සාකච්ඡාවලදී ඔවුන් විශාල වශයෙන් බැහැර කරන ලදි. එම අවස්ථාවේ සාමය ගොඩනගන කාන්තාවන් හා සිරියාව සඳහා වූ එක්සත් ජාතීන්ගේ තානාපතිවරයා අතර රැස්වීමක් ලබාගැනීම සඳහා සහයෝගය ලබාදෙන තෙවෙනි පාර්ශ්වයේ රජයන් තමන්ගේ දේශපාලන බලපෑම පාවිච්චි කළහ. කාන්තා නියෝජිතවරියන් එම සාකච්ඡා වටයට ඇතුළත් කිරීමට නොහැකි වූ අතර, විධිමත් ක්‍රියාවලියේ මුලදී සම්බන්ධ වීම හරහා ඔවුන් ප්‍රතිලාභ ලබා ගත්හ. කාන්තාවන් ඇතුළත් කළයුතු බවට බාහිරව එල්ල කරන ලද බලපෑම ක්‍රමානුකූල සබඳතාවලට මඟපෑදීය. අද අනෙකුත් විධිමත් සමථකරණ ක්‍රියාවලියන් සමඟ සංසන්දනය කරන විට, මඟ I නියෝජිතවරුන් සිරියාවේ කාන්තාවන් සම්බන්ධ කරගැනීම ඉතා බහුල ලෙස සිදුවේ.

## කොටුව 3 - සමථකරණයේ ඇතුළත් කරගැනීම සඳහා සිවිල් සමාජය හඳුනාගැනීම සඳහා වූ නියැදි නිර්ණායකය

ගැටුම් පරිසරයන් තුළ පැරණි හා නව සිවිල් සමාජ කණ්ඩායම් සිටිති. සමථකරණ ක්‍රියාවලියේ ඇතුළත් කරගැනීම පිණිස සාම සාකච්ඡාවට දායකත්වයක් ලබාදිය හැක්කේ කුමන සිවිල් සමාජ සංවිධානවලට දැයි හඳුනාගැනීම සඳහා නිර්ණායකයන් සමූහයක් අවශ්‍ය වේ. පහත සඳහන් නියැදි නිර්ණායකයන් ජාත්‍යන්තර සමථකරණ විශේෂඥයන් හා ගෝලීය වශයෙන් සාමය සඳහා හඬ නගන අයගෙන් ලබා ගන්නා ලදි.

**මූලික හරයන් හා පහත සඳහන් දේවල් සඳහා කැපවීම.**

- අවිහිංසාවාදය හා ආරාවුල් සාමයෙන් විසඳා ගැනීම.
- මානව හිමිකම්, කාන්තා හිමිකම් හා සාමය.
- ආරක්ෂාව හා පාලනය පිළිබඳ ගැටළුවලදී ස්ත්‍රී-පුරුෂ සමාජභාව සංවේදීභාවය.
- දේශපාලන ස්වාධීනත්වය හා/හෝ අපක්ෂපාතිත්වය

- කාන්තාවන්, තරුණ තරුණියන්, සුළු ජාතීන් හා කොන් වූ ජන කණ්ඩායම් වැනි විවිධ කණ්ඩායම් නියෝජනය කිරීම/ඇතුළත් කරගැනීම.

**අඩුම වශයෙන් පහත සඳහන් ක්ෂේත්‍රවලින් එකක නිපුණතාවය:**

- යථාර්ථ තත්ත්වයන් පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් අවබෝධය.
- කාන්තාවන්/සිවිල් සමාජ සංවිධාන නියෝජනය කිරීම පිළිබඳව අතීත අත්දැකීම්
- ආධාර හෝ විකල්ප ජීවනෝපාය ලබාදීම.
- සන්නද්ධ කණ්ඩායම්වලට ලඟාවීම හා/හෝ සන්නද්ධ කණ්ඩායම් වලට බඳවා ගැනීම වැළැක්වීම.
- නිරායුධකරණය/පුනරුත්ථාපනය හා පුරවැසි/ප්‍රජා ආරක්ෂාව.
- සමථකරණය/සාමය ගොඩනැගීම වැනි කාර්යවල - විශේෂයෙන් ප්‍රජාවන් අතර තිබෙන අත්දැකීම්.
- සමාජ සමගිය හා සාමය පිළිබඳ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම.

- යුක්තිය හා සංහිඳියාව පිළිබඳ ගැටළු ගැන අවධානය යොමු කිරීම හා වින්දිතයන් සමඟ වැඩ කිරීම.
- ප්‍රාදේශීය ප්‍රජාවන් හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ අවබෝධයක් සහිතව දේශීය සම්පත් හා ඉඩම් අයිතීන්ද ඇතුළුව සම්පත් ගැටළු.

ඇතුළත් කරගන්නා කණ්ඩායම්වල ස්වභාවයඃ විවිධ සංවිධාන හා කණ්ඩායම් ඔවුන්ගේ ප්‍රමාණය අනුව ඇතුළත් කර ගත හැකිය. කෙසේවෙතත්. පහත සඳහන් දේවල් සතු සංවිධාන ඇතුළත් කරගැනීම ප්‍රයෝනවත් වේ.

- '' ක්ෂේත්‍රයේදී, කණ්ඩායමක් සමඟ සම්බන්ධයක් පැවතීම.
- කොන් වූ කණ්ඩායම්ද ඇතුළුව ප්‍රාදේශීය ප්‍රජාවන්ට කරුණු දැක්වීම හා ඔවුන්ගේ අදහස් ලබාගැනීම සඳහා ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයන්.
- මහජන මතය නිර්මාණය කිරීමට හා එහි බලපෑම් කිරීමට තිබෙන හැකියාව.
- කාන්තාවන්, තරුණ තරුණියන්, සුළු ජාතික කණ්ඩායම් හා/හෝ භූගෝලීය වශයෙන්/ජනවාර්ගික ප්‍රදේශ/ආගමික ප්‍රජාවන්ගේ නියෝජනය.

## බාධක හතර :
## " මෙය කාන්තාවන්ට සම්බන්ධ දෙයක් නොවේ" , හමුදාමය හා ආරක්‍ෂාව පිළිබඳ ගැටළු 'තාක්‍ෂණික' ගැටළු වන අතර, ඒවා සාමය ගොඩනගන කාන්තාවන්ට 'අදාළ නොවේ .

හමුදාමය හා ආරක්‍ෂාව පිළිබඳ ගැටළු කාන්තාවන්ගේ ගැටළු වලට අදාළ නොවන නිසා සාම සාකච්ඡාවලදී ඔවුන් ඇතුළත් කරගැනීමට අවශ්‍ය නැතැයි සමහරු තර්ක කරති. අනෙක් අතට "කාන්තාවන්ගේ ගැටලු " ආරක්‍ෂාව පිළිබඳ න්‍යාය පත්‍රයකට අදාළ නොවන බවද මතයක් පවතී. නමුත් මෙම ගැටලු, ගැටුමකදී ලිංගික ප්‍රචණ්ඩත්වයේ සිට සටන් විරාම අවස්ථාවලදී සාමාන්‍ය ජනතාවගේ ආරක්‍ෂක අවශ්‍යතාවයන් දක්වා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරන බව ඔවුන් නොසලකා හරිති. සාම සාකච්ඡාවල කාන්තාවන්ද ඇතුළත් කරගන්නා අවස්ථාවල, එම කාන්තාවන්, සාකච්ඡාවට ලක් කළ යුතු ගැටළු සමූහය අඛණ්ඩව පුළුල් කරන අතර, කෙටි කාලීන හා දිගු කාලීනව ආරක්‍ෂාව හා සංවර්ධනය පිළිබඳ ගැටළු මතු කරති. මෙය අවසානයේදී සියළු දේවල් ඇතුළත් ගිවිසුමකට හා කල් පවතින සාමයකට උපකාරී වේ.

## මෙම බාධකය ජය ගත හැක්කේ කෙසේද?:

1. කාන්තාවන් මතුකරන බොහෝ මාතෘකාවන් ආරක්ෂාවට අදාළ මාතෘකාවන් බව පෙන්වා දෙන්න. බිම් බෝම්බ පවතින ප්‍රදේශ, තර්ජන හා හමුදා ක්‍රියාධරයන් මතු නොකරන සාමාන්‍ය ජනතාවගේ ආරක්ෂක අවශ්‍යතා යන කරුණු පිළිබඳ දැනුමද මෙයට ඇතුළත් වේ.

2. ප්‍රචණ්ඩත්වයේ වෙනස්වන ප්‍රවණතාවයන් පිළිබඳ කාන්තාවන්ගේ තියුණු අවබෝධය පෙන්වා දෙන්න. අවධානම් තත්ත්වයන් අධීක්ෂණය කිරීමේ ඔවුන්ගේ හැකියාවද මෙයට ඇතුළත් වේ. ඔවුන් ගැටුම් තත්ත්වයන් තුළ වැඩි වශයෙන් එහා මෙහා යා හැකි තත්ත්වයක සිටින අතර, බෙදා හදා ගතහැකි වැදගත් ප්‍රාදේශීය දැනුම් සම්භාරයකින්ද සන්නද්ධව සිටිති.

3. කාන්තාවන් තමන්ගේ ප්‍රජාවන් සමඟ මනා සබඳතාවයකින් සිටින බවත්, සටන් විරාම/අධීක්ෂණ කණ්ඩායම්ල අති දක්ෂ සාමාජිකාවන් ලෙස ඔවුන්ට සේවය කළ හැකි බවත් සටහන් කරන්න.

4. සාමය ගොඩනගන කාන්තාවන් කෙරෙහි ඔවුන්ගේ ප්‍රජාවන් තුළ විශ්වාසයක් පවතී. ඔවුන්ට ප්‍රජා මත සමීක්ෂණවලට සහයෝගය ලබාදිය හැකි අතර, ආරක්ෂක තර්ජන, සටන් විරාම හා අනෙකුත් කරුණු පිළිබඳ සාමාන්‍ය ජනතාව තුළ තිබෙන මතයන් පිළිබඳ වටිනා තොරතුරුද රැස්කළ හැකිය.

5. ගැටුමට අදාළ ලිංගික ප්‍රචණ්ඩත්වය බොහෝ අවස්ථාවල ගැටුම උත්සන්න කිරීමේ ප්‍රධාන සාධකයක් ලෙස පවතින බවත්, එය සටන් විරාම ගිවිසුම් දුර්වල කරන බවත් කාන්තාවන් දැන සිටිති. සාම සාකච්ඡාවලදී මෙම ගැටලුව ආමන්ත්‍රණය කළහොත් එය පුළුල් ක්‍රියාවලිය පිළිබඳ විශ්වාසය ගොඩනගන අතර, සාකච්ඡා අසාර්ථක වුවහොත් සිදුවන හානියද අවම කරයි.

2010 ඔක්තෝබර් මාසයේ මින්ඩානෝ මහජන කවය විසින් සටන් විරාම ගිවිසුම් අධීක්ෂණය කිරීම සඳහා දියත් කරන ලද කාන්තාවන්ගෙන් සැදුම් ලත් සිවිල් ආරක්ෂක කණ්ඩායමක් සේවාවේ යොදවන ලදි. මුලදී මෙයට සම්බන්ධ වූ කාන්තාවන් 30 දෙනා පිලිපීනයේ විවිධ ජනවාර්ගික හා ආගමික

පසුබිම් වලට අයත් කාන්තාවන් වූහ. ඔවුන් බොහෝ දෙනා කාන්තාවන්ගේ යුධ අත්දැකීම් පිළිබඳ වැඩි වශයෙන් අවධානය යොමු කරවා ගැනීමට හඬ නැගූ අතර. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1325 පිළිපැදීම කෙරෙහිද අවධානය යොමු කළහ. වයස් කණ්ඩායම් 20-62 වලට අයත් මෙම කාන්තාවන් මින්ඩානෝ ප්‍රදේශයේ ගැටුම්වලින් පීඩාවට පත් සියළුම ප්‍රදේශවල සේවාවේ යොදවන ලද අතර, සිවිල් ප්‍රජාවගේ ආරක්ෂාව අධීක්ෂණය කිරීම, ගැටුමට සම්බන්ධ පාර්ශවයන් ආගමික සිද්ධස්ථානවලට ගරු කිරීම තහවුරු කිරීම, ප්‍රාදේශීය ජනතාවට හා අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයන්ට සහන සේවා ලබාදීම අධීක්ෂණය කිරීම මෙම ක්‍රියාවලියෙහි ප්‍රාදේශීය අයිතිය තහවුරු කිරීම හා සාම ක්‍රියාවලිය පිළිගැනීමට ලක් කිරීම වැනි පැහැදිළි වරමකින් ඔවුන් කටයුතු කළහ. සමහර හමුදා නායකයන් හා ආගමික නායකයන් මුලදී කාන්තාවන් පිළිබඳ සැකෙන් බැලූ නමුත්, ප්‍රජාවගෙන් ලැබුණු ප්‍රතිචාරයන් ධනාත්මක විය. ඔවුන්ගේ විවිධත්වය හේතුවෙන් යුද්ධයේ පැටලී සිටි විවිධ ප්‍රජාවන් අතර පාලමක් ගොඩනැගීමට

ඔවුන්ට හැකි වූ අතර, මෙම සාමාජිකයන් යුද්ධ කාලය පුරාම අත්දැකීම් ලබා සිටි හෙයින් සාමාන්‍ය ජනතාව කෙරෙහි ගැඹුරු කරුණාවක් හා කැපවීමක් ඔවුන් සතුව තිබිණි. තවද, හමුදාව හා කැරළිකරුවන් සමඟ ඵලදායි ආකාරයෙන් සාකච්ඡා පැවැත්වීමටද ඔවුන් කැමැත්තක් දැක්වූහ.

## බාධක 5 :
## " මගේ සුදුසුකම් නිසා පමණයි මම මෙහි සිටින්නේ "අප කාන්තාවන් නියෝජනය කරන්නේ නැත" යැයි කාන්තා නියෝජිතයන් කියන අවස්ථාව.

කාන්තාවන් ඇතුළත් කරගැනීම සඳහා වූ විරෝධතාවය සන්නද්ධ කණ්ඩායම් හෝ රාජ්‍ය ක්‍රියාධරයන්ගෙන් පමණක් නොව සිවිල් සමාජයෙන්ද එල්ල විය හැකිය. මෙය කාන්තා නියෝජතවරියන් හා සිවිල් සමාජ කණ්ඩායම් අතර ප්‍රශ්න මතුකළ හැකිය. සමහර අවස්ථාවල කාන්තා නියෝජතවරියන් තමන් බිම් මට්ටමේ කාන්තාවන්ගෙන් වෙන් කොට දැක්වීමට උත්සාහ දරති. සාම සාකච්ඡා මේසයේ ඔවුන් වාඩි වීම දැඩි පරිශ්‍රමයකින් ඔවුන් කර ඇති වැඩ හා ඔවුන්ගේ සුදුසුකම් හේතුවෙන් ලබාගත් දෙයක් බව පෙන්වීමට ඔවුන්ට අවශ්‍යවේ. කාන්තාවන්ට අවස්ථාවක් ලබාදීම සංකේතයක් වශයෙන් කරන දෙයක් ලෙස සැලකිය හැකි යැයි යන බියෙන් ඔවුන් එසේ කරති. සාම සාකච්ඡා පවත්වන මේසයේ කාන්තාවක් සිටීම පමණක් ඇය තමන්ගේ රටේ සියළුම කාන්තාවන්ගේ නියෝජිතවරියෙක් ලෙස පත් නොකරයිත තවද එය ඇය සාමය ගොඩනගන

ප්‍රජාවන්ට සම්බන්ධ වී සිටීම තහවුරු නොකරන බවද අපි මතක තබා ගත යුතුය.

## මෙම බාධකය ජය ගන්නේ කෙසේද :

1. කාන්තා නියෝජිතවරියන් සාමය ගොඩනගන කාන්තාවන් සමඟ හා ඔවුන්ගේ ඉදිරි ගමනට සහයෝගය ලබාදෙන සිවිල් සමාජ කණ්ඩායම් සමඟ සම්බන්ධ වීම උනන්දු කරවීම.
2. තමන් නායකත්ව තත්ත්වයන්ට ප්‍රවර්ධනය කර, ඔවුන්ගේ පත්වීම් සඳහා හඬ නැගූ කණ්ඩායම් වලට කාන්තා නියෝජිතවරියන් බැඳී සිටින ආකාරයේ ආචාර ධර්ම පද්ධතියක් ඇති කර ගැනීම. මෙම අර්ධ වශයෙන් බඳවා තබන ගිවිසුම සාම ක්‍රියාවලිය සඳහා වූ ඔවුන්ගේ මෙහෙවර සඳහා හඬ මතු කළ හැකිය.
3. සාම සාකච්ඡා මේසයේ ආසන ලබාදී ඇති කාන්තාවන්ට සහයෝගය හා මඟ පෙන්වීම ලබාදීම. ඔවුන්ගේ පුද්ගලික හා දීර්ඝ කාලීන පුහුණු පහසුකම් සඳහා ආයෝජනය කිරීම. කාන්තාවන්ට කායික වශයෙන් අනතුරුදායක තත්ත්වයන් තුළ වැඩ කිරීමට හැකියාව ලබාදෙන නිර්මාණාත්මක පියවරයන් මෙයට ඇතුළත් කළ හැකිය.

විශේෂයෙන් ගැටුමට අදාළ ක්ෂේත්‍රවල කාන්තාවන්ට දැනුම හා කුසලතාවයන් ලබාදීම. මෙය සාම ක්‍රියාවලිය වැඩිදියුණු කරනවා පමණක් නොව එයට වැඩි විශ්වසනීයත්වයක්ද ලබා දෙයි.

4. සාකච්ඡාවලදී බලපෑම් ඇති කිරීම සඳහා උපාය මාර්ගික පුහුණුව ලබාදීමත උදා. වශයෙන් කාන්තා නියෝජිතවරියන් ස්ත්‍රී-පුරුෂ බේදීම තුරන් කිරීමට උත්සාහ කළ යුතු අතර, තත්ත්වය හෝ ජ්‍යෙෂ්ඨත්වය කුමක් වුවත් පිරිමි පාර්ශ්වයේ මිත්‍ර පාක්ෂිකයන් සතුව සිටිය යුතුයි.

කාන්තා නියෝජිතවරියන් කාන්තා අයිතීන් සඳහා වැඩි වශයෙන් හඬ නැගීමට විභවයක් සතුව සිටින අතර, සිවිල් සමාජ හඬවලට සහයෝගය ලබාදිය හැකි තත්ත්වයේද සිටිති. කෙසේවෙතත් ඔවුන් නායකත්ව තත්ත්වයන්ට පිවිසෙන අවස්ථාවල. සාර්ථකව ක්‍රියා කිරීම සඳහා ඔවුන්ට සහයෝගය හා දැනුම අවශ්‍ය වේ. වත්මන් ගැටුම්වලදී මෙය වෙනස් වූ ආකාරයෙන් සිදුවී ඇත. දකුණු සූඩානයේ පත්කළ කාන්තාවන් සිවිල් සමාජය හා කාන්තා කණ්ඩායම් සමඟ පැවැත්වූ තමන්ගේ සබඳතා විසන්ධි කර ගත් අතර, ආණ්ඩු පක්ෂයේ ස්ථාවරයට අවනතව කටයුතු කළහ.

කෙසේවෙතත්, පිලිපීනයේ රජයේ කණ්ඩායමේ සිටි සාමය ගොඩනගන කාන්තාවන් සිවිල් සමාජය සමඟ දැඩි සම්බන්ධතාවයක් පවත්වා ගෙන ගිය අතර, සාම සාකච්ඡාව හා බැන්ස්මෝරෝ සංක්‍රාන්ති නීතිය පිළිබඳ වාද විවාද තමන්ගේ අදහස්වලින් පෝෂණය කළහ.

## බාධක භය :
## ‘ කාන්තාවන් බැහැර කිරීම සංස්කෘතික දෙයකි’ හා ‘ සාම සාකච්ඡා පවත්වන මේසය ස්ත්‍රී- පුරුෂ සමාජභාවය සමානාත්මතාවය පිළිබඳ කතා කරන ස්ථානයක් නොවේ.

සාම ක්‍රියාවලීන්වල කාන්තාවන් බැහැර කිරීම සංස්කෘතික දෙයක් නම්, කොළොම්බියාව හා සිරියාව, බුරුමය හා බුරුන්ඩි යන රටවල්වල අතර අපට විශාල වෙනස්කම් දැක ගත හැකිය. මෙම රටවල් එකිනෙක බොහෝ දුරට වෙනස් වූ රටවල් විය. නමුත් සාමය ගොඩනැගීමේ ක්‍රියාවලියෙන් කාන්තාවන් බැහැර කිරීම මෙම රටවල්වලට පොදු දෙයක් විය. එය ගෝලීය වශයෙන් සිදුවන සංසිද්ධියකි. අනෙකුත් සාධක මෙයට අදාළ වන බවත්, විශේෂයෙන් සාම සාකච්ඡා සිදුකරන ස්ථානයේ බලය පිළිබඳ කේවල් කිරීමක් හා හුවමාරුවක් සිදුවන බවද සඳහන් වේ. සාම සාකච්ඡා මේසයට පැමිණෙන අයට එය සීමිත ස්ථානයක් බවට පත්කර ගැනීමේ අවශ්‍යතාවය පවතී. බලය බෙදා හදා ගැනීමට හෝ විකල්ප බලවේගයන්ට වගවීමට ලක්වීමට ඔවුන්ට අවශ්‍ය වන්නේ නැත. ඒවාගේම සාම සාකච්ඡා පවත්වන මේසය සංවේදී සංස්කෘතික මානයන් ආමන්ත්‍රණය කරන ස්ථානයක් නොවන බව සමහර අය තර්ක කරති.

කාන්තාවන්ගේ සහභාගිත්වය හරහා හෝ න්‍යායපත්‍රයේ ස්ත්‍රී-පුරුෂ සමාජභාව සමානාත්මතාවය පිළිබඳ ගැටළු ඉදිරිපත් කිරීම තුළින් මෙය සිදුකළ නොහැකිය. කෙසේවෙතත්, ස්ත්‍රී-පුරුෂ සමාජභාව සමානාත්මතාවය ඉල්ලා සිටීම සඳහා පමණක් කාන්තාවන් සාම මේසයට පැමිණෙන බව පවතින මතය වැරදි එකක් වේ.

## මෙම බාධකය ජය ගන්නේ කෙසේද? :

1. යුද්ධයේ ප්‍රතිවිපාක කාන්තාවන්ගේ හා පිරිමින්ගේ ගැටලු බව සඳහන් කිරීමෙන් මෙම ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන්නඩ යුධ කලාපවල සාමය ගොඩනගන කාන්තාවන් බොහෝ අවස්ථාවල තමන්ගේ ප්‍රජාවගේ අවශ්‍යතාවයන් පිළිබඳව විශේෂයෙන් පිරිමින් මුහුණදෙන තර්ජනයන් ගැන-කතා කරති.
2. සාමය ගොඩනගන කාන්තාවන් බොහෝ අවස්ථාවල සියළු දෙනාටම අදාළ වන වැදගත් ගැටළු මතු කරති. (උදා. වශයෙන් ස්ත්‍රී-පුරුෂ සමාජභාව දෘෂ්ඨි කෝණයකින් සම්පත් බෙදා හදා ගැනීම. පොලිස් ප්‍රතිසංස්කරණ හා ආරක්ෂක අංශයේ ප්‍රතිසංස්කරණ වැනි දේවල්).
3. තොරතුරු ලබාදීමට හා න්‍යායපත්‍රයේ ඇතුළත් කළ යුතු ප්‍රධාන මාතෘකා පිළිබඳ අදහස් ලබාගැනීම සඳහා සාමය ගොඩනගන

කාන්තාවන් කැඳවන්න. ස්ත්‍රී පුරුෂ සමාජභාව ගැටළු හා කාන්තාවන්ගේ අවශ්‍යතාවන් පමණක් ගැන ඔවුන් සමග' කතා නොකරන්න.

4. න්‍යායපත්‍රයේ ඇතුළත් එක් එක් ප්‍රධාන මාතෘකා පිළිබඳ තමන්ගේ කණ්ඩායම්වල සිටින කාන්තාවන්ගේ හා පිරිමින්ගේ වෙනස් වූ අත්දැකීම් හා අවශ්‍යතාවයන් පිළිබඳ අසන්න (ඉඩම් අයිතීන්, හමුදාව විසුරුවා හැරීම වැනි දේවල්).

සාම මේසයේ ඇති කර ගන්නා එකඟතාවයන් කාන්තාවන්, සුළු ජාතීන් හා අනෙකුත් කණ්ඩායම් ඇතුළත් සමස්ථ සමාජයේම අනාගතයට අවශ්‍ය සැලැස්ම ඉදිරිපත් කරයි. මෙම කණ්ඩායම්වලට සාම සාකච්ඡා මේසයේ නියෝජනයක් ලැබෙන්නේ නැත්නම්, ඔවුන්ගේ අනාගතය පිළිබඳ අවදානමකට ඔවුන් ලක් වෙති. අචේ සාම සාකච්ඡාව, කාන්තාවන්ගේ අයිතීන් පිළිබඳ ඉතා ප්‍රතිගාමී න්‍යායපත්‍රයක් ඉදිරිපත් කළ ඉස්ලාමීය බලවේගයක නැගීමකට මඟපෑවේය. එක කණ්ඩායමක සමාජයේ එක කොටසක යහපත වෙනුවෙන් එළඹෙන සාමය පිළිබඳ එකඟතාවයන්, තවත් කොටසකට - විශේෂයෙන් ඔවුන් ජනගහණයෙන් අඩක් හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් සිටින අවස්ථාවල-හානියක් ඇති කරන ආකාරයෙන් සිදු නොවිය යුතුයි.

# අංශය 2

# යහපත් සාමයක් සඳහා මඟ පෙන්වන ක්ෂේත්‍ර 4 ක් , ඇතුළත් කරගැනීම සාර්ථක කරගැනීම සඳහා සක්‍රීය පියවරයන්

## මෙම මෙවලම පාවිච්චි කරන්නේ කෙසේද? කොයි මොහොතේද ඃ

සමථකරණ ක්‍රියාවලියක මූලදීම-නිල ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර වුනත්-ක්‍රියාධරයන් හා න්‍යායපත්‍රයන් තාම සැකසෙමින් තිබෙන අවස්ථාවක ඇතුළත් කරගැනීම පහසු වන අතර, එය සාර්ථක අන්දමින් කළ හැකිය. කෙසේවෙතත් ඕනෑම මොහොතක එය කළ හැකිය.

ක්‍රියාවලියේ සෑම අවධියකම සමකාලීනව ක්‍රියා කළ යුතු එකිනෙකට සම්බන්ධ සහයෝගය ලබාදෙන ක්ෂේත්‍ර 4 ක් ඇත ඃ

- විවිධ විශ්ලේෂණයන් පිළිගැනීම හා ප්‍රාදේශීය පාර්ශ්වකරුවන් පවත්වන සාම සාකච්ඡාවල පසුබිම්, වෙනස්වූ ක්‍රියාධරයන් හා අරමුණු වැනි දේවල් අවබෝධ කරගැනීම.

- විධිමත් හා අවිධිමත් පසුබිම්වල ඇතුළත් කරගැනීම සඳහා දේශපාලන සහයෝගය ලබාදීම.
- වැදගත් ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීමේ ඔවුන්ගේ කුසලතා හා ධාරිතාවයන් ශක්තිමත් කිරීම සඳහා තාක්‍ෂණික සහාය හා නිපුණත්වය ලබාදීම.
- සාමය ගොඩනගන කාන්තාවන්ට නිසි කලට පොදු පහසුකම් හා මූලාධාර ලබාදීම.

සාර්ථකව කාන්තාවන් ඇතුළත් කර ගැනීම සඳහා වූ වඩා හොඳ සාම මෙවලමේ ව්‍යුහාත්මක ප්‍රවේශය සාම ක්‍රියාවලියේ සෑම අවධියකම සැලකිල්ලට ගතයුතු ක්‍රියාකාරී ක්ෂේත්‍ර 4 ක් පෙන්වා දෙයි.

## සුදානම්වීම/සාකච්ඡාවට පෙර, සාම සාකච්ඡා සිදුවන අවස්ථාවේ හා ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවේ

**සංකල්ප හා විශ්ලේෂනාත්මක:**
පසුබිම අවබෝධ කරගැනීම හා ගැටුම විශ්ලේෂණය කිරීම හා සාමය ගොඩනගන කාන්තාවන් සමග සාම සාකච්ඡා කිරීමේ අරමුණ අවබෝධ කරගැනීම.

**දේශපාලන සහාය:**
සමථකරණය, ප්‍රධාන රැස්වීම, සමුළු හා සාකච්ඡාවලදී සාමය ගොඩනගන කාන්තාවන් ඇතුළත් කරගන්නා ලෙස බල කිරීම.

**තාක්ෂණික සහාය:**
සාමය ගොඩනගන කාන්තාවන්ට ආරක්ෂාව, පාලනය, ස්වභාවික සම්පත් හා ක්‍රියාවලියේ තිබෙන අනෙකුත් ගැටලු පිළිබඳ ස්ත්‍රී-පුරුෂ සමාජභාව සංවේදී නිපුණත්වය ලබාදීම.

**පොදු පහසුකම් හා මූලාධාර:**
ගමනාගමනය, ආරක්ෂාව හා වීසා බලපත්‍ර ලබාදීම මගින් හා නිසි කලට අරමුදල් ලබාදීම මගින් කාන්තාවන්ගේ සහභාගිත්වය තහවුරු කිරීම.

## I. සමථකරණ පසුබිම අවබෝධ කර ගැනීම

1. ගැටුම හා සාමය ඇති කරන හේතු / පෙළඹවීම් පිළිබඳ දැන ගන්න.
2. අදාළ ගැටුම පිරිමින් හා කාන්තාවන් කෙරෙහි වෙනස් වූ ආකාරයන් ඇති කරන බලපෑම් පිළිබඳ අසන්න. ඔවුන් මෙයට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද? ප්‍රාදේශීය ජනතාවගේ අනාගත දැක්ම මොකක්ද?

" සාමය සඳහා ජාත්‍යන්තර ප්‍රජාව පාවිච්චි කරන නිර්වචනය මොනවාද? සාමය පිළිබඳ නිසි නිර්වචනයක් නොතිබේ නම්, සාම ක්‍රියාවලියක් තිබිය හැකිද?"

Dana B ,
සාම ක්‍රියාධාරිනි , සිරියාව

3. දැනට සිටින හෝ අළුතින් එකතු විය හැකි සිවිල් සමාජ සාම ක්‍රියාධරයින් ඇතුළුව ක්‍රියාධරයින් සිතියම් ගත කරන්න. ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධානවලින් හෝ ඔබගේ ආයතනයේ සිටින ස්ත්‍රී-පුරුෂ සමාජභාවය / ඇතුළත් කරගැනීමේ විශේෂඥයාගේ සහය පතන්න.

4. ප්‍රසිද්ධව හා පුද්ගලිකව කාන්තාවන් බලය ලබා ගන්නා ආකාරය හා එයට බලපෑම් කරන ආකාරය අසා දැන ගන්න. එවිට පසුබිම් සංවේදීව කටයුතු කළහැකි අතර, එය කාන්තාවන් බල රහිත නොකරයි.

5. ඔවුන්ගෙන් පහත සඳහන් දේවල් ඉල්ලා සිටීම සඳහා සාමය ගොඩ නඟන කාන්තාවන් හමුවන්න,

(අ) න්‍යාය පත්‍ර මාතෘකාවල ස්ත්‍රී-පුරුෂ සමාජභාව කරුණු පිළිබඳ විශ්ලේෂණය.

(ආ) කාන්තාවන් සහභාගි කරවා ගැනීම සඳහා අතීතයේ ගන්නා ලද උත්සාහයන් සිතියම් ගත කිරීම.

(ඇ) ආරක්ෂක, මානුෂීය හා අනිකුත් ප්‍රධාන ගැටළු සඳහා වූ විසඳුම්.

6. සමථකරණ උපාය මාර්ගයේ සාමය ගොඩනගන කාන්තාවන් ඇතුළත් කරන්න. එවිට විධිමත් මඟ I ක්‍රියාවලියෙන් ඔවුන් හුදකලා වන්නේ නැත.

7. ගැටුමේ සෑම පාර්ශ්වයකටම අයත් කාන්තාවන්, කොන් වූ ප්‍රජාවන් හා සිවිල් පුරවැසියන් සම්බන්ධ කර ගන්න. පුළුල් සාකච්ඡා සඳහා බහු පාර්ශ්වීය හා

ජාත්‍යන්තර සහයෝගය ලබා ගන්න. අවශ්‍ය නම් මුළුමනින්ම කාන්තාවන්ගෙන් සමන්විත ස්ථානයක් ලබා දෙන්න.

## සැලකිය යුතු කරුණු :

- කාන්තාවන් සමඟ 'කාන්තා ගැටලු' ගැන පමණක් කතා නොකරන්න. සෑම ගැටලුවක් පිළිබඳවම ඔවුන්ගේ දෘෂ්ටි කෝණය ලබා ගන්න. මාතෘකා පදනම් කරගත් සාකච්ඡාවලට ඔවුන්ට ආරාධනා කර, එහි තමන්ගේ අදහස් ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටින්න.

- සාම සාකච්ඡා, අදහස් විමසීම් හෝ සුදානම් කිරීම් රැස්වීම්වලට සහභාගි වන සාමය ගොඩනඟන කාන්තාවන්ට කිසිම රාජ්‍යකින් හෝ සන්නද්ධ කණ්ඩායම් වලින් ප්‍රහාරයක්, අඩන්තේට්ටමක්, සිරිගත කිරීමක් හෝ හිරිහැරයක් නොවන බවට ආරක්ෂක තහවුරුවන් ලබා ගැනීම වැදගත් වේ. සන්නද්ධ කණ්ඩායම් වලට ආරක්ෂාව ලබාදෙන ආකාරයටම මෙම කාන්තාවන්ටද ආරක්ෂාව ලබා දිය යුතුයි.

"සාමය ගොඩනගන කාන්තාවන් ඉතාම අනතුරුදායක ක්‍රියාවක යෙදී සිටිති."

**- තානාපති ඩොන් ස්ටීන්බර්ග්,**
World Learning ආයතනයේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි, අංගෝලාව සඳහා වූ හිටපු එක්සත් ඇමරිකා ජනපදයේ තානාපති

## II. ඇතුළත් කර ගැනීම සඳහා දේශපාලන සහයෝගය ලබා දෙන්න



1. සමථකරුවා වෙත පවරන බලතලවලට එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාව 1325 ක්‍රියාත්මක කිරීම ඇතුළත් කරන්න. කාන්තාවන් හා සිවිල් සමාජ සංවිධානවල සහභාගිත්වය, තෝරාගැනීම සඳහා වූ ප්‍රධාන නිර්ණායකයක් ලෙස තබා ගන්න.

2. ආරාවුල් සාමකාමී ලෙස සමථකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ යෝජනාව හා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාව 1325 න්‍යාය පත්‍රය සඳහා වූ ඔබගේ ආයතනයේ කැපවීම පුද්ගලිකව හා ප්‍රසිද්ධව පෙන්නුම් කරන්න.

3. ඔබගේ කණ්ඩායමේ ස්ත්‍රී-පුරුෂ සමාජභාව සමානාත්මතාවය හා විශේෂඥ දැනුම ඇතුළත් කර ගැනීමට කැප වෙන්න (සාකච්ඡා කිරීමේ කණ්ඩායම්වල/දූත පිරිස්වල කාන්තාවන්ට 30% ක අවම පංගුවක් ලබාදීම) විශේෂ නිපුණතාවයන් සතු කාන්තා සාමය ගොඩනගන්නන් සොයා ගන්න.

4. පාර්ශ්වකරුවන් හා සමථකරුවන් සමඟ බහුවිධ ඇතුළත් කර ගැනීමේ ආදර්ශයන්/ ක්‍රමවේදයන් මත බෙදා හදා ගන්න. ඒවා වැදගත් වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. එක ක්‍රමවේදයක් පමණක් විශ්වාස නොතබන්න.

5. ජාත්‍යන්තර සුදානම් වීමේ, උපාය මාර්ගික හෝ ක්‍රියාත්මක කිරීමේ රැස්වීම්වල /සමුළුවල කතා පවත්වන ලෙසත් සහභාගි වන ලෙසත් සාමය ගොඩනගන කාන්තාවන්ට ආරාධනා කරන්න. සූදානම් වීම සඳහා ඔවුන්ට යාවත්කාලීන කරන ලද තොරතුරු, සහයෝගය හා කාලය ලබා දෙන්න.

6. සාම ගිවිසුම් වලට අත්සන් තබන අය ලෙස සාමය ගොඩනගන කාන්තාවන්ද ඇතුළත් කර ගන්නා ලෙස ඉල්ලීම් කරන්න - ලයිබීරියා, සෝමාලියාව, උතුරු අයර්ලන්තය වැනි රටවල්වල පූර්වාදර්ශයන් පෙන්වා දෙන්න.

7. සංක්‍රාන්ති හෝ ක්‍රියාත්මක කිරීමේ ආයතන සැලකිල්ලට ගතයුතු කරුණුවලදී ස්ත්‍රී-පුරුෂ සමාජභාව සංවේදීභාවය ඇතුළත් කර තිබේ දැයි සොයා බලන්න.

8. ජාත්‍යන්තර දූත කණ්ඩායම් රාජ්‍ය තන්ත්‍රික කණ්ඩායම් හා රාජ්‍ය තන්ත්‍රිකයන් සමඟ සාමය ගොඩනගන කාන්තාවන් හමුවී නිතිපතා සාකච්ඡා පැවැත්වීමට අවස්ථාවන් සලසා දෙන්න. සාකච්ඡාවට පෙර හා ක්‍රියාත්මක කිරීමේ අවදිවලද මෙවැනි රැස්වීම් පැවැත්විය යුතුයි.

9. ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා මාතෘකා අනුව ක්‍රියා කරන ජාතික ක්‍රියාකාරී කණ්ඩායම් ස්ථාපිත කරන්නත ස්ත්‍රී-පුරුෂ සමජභාවය අධීක්ෂණය කිරීම හා තහවුරු කර ගැනීම සඳහා එයට 1325 කණ්ඩායමක් ඇතුළත් කරන්න. 2008 නේපාලයේ කරන ලද ආකාරයට එම සාමාජිකයන්ද, අනිකුත් ඒ අනුව වැඩ කරන අනෙකුත් කණ්ඩායම්ද සම්බන්ධ කරන්න.

10. සාමයට ලැදි කාන්තා කණ්ඩායම් වලට ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙහි අවධානය යොමු කිරීම සඳහා අරමුදල් ලබාදීමෙන් කඩකප්පල්කාරීන්ගෙන් විය හැකි අවධානම්

අවම කරන්න. ගිවිසුමකට එළඹීමෙන් පසු ඇති විය හැකි සෘණාත්මක වෙනස්කම් පිළිබඳ අනතුරු අඟවන්න.

## සැලකිල්ලට ගතයුතු වැදගත් කරුණුඃ

ආගමික හෝ ගෝත්‍රික නායකයන් වැනි වැඩිහිටියන් මඟ I හෝ මඟ II සාකච්ඡා වලට ආරාධනය කරන්නේ නම්, විශ්වසණීය ගරුත්වයෙන් යුත් හා මානව හිමිකම් හා සමානාත්මතා අගයන්ට ගරු කරන නායකයන් කවරහු දැයි සාමය ගොඩ නගන කාන්තාවන් ගෙන් විමසන්න.

විධිමත් සාකච්ඡාවල සහභාගිවීම පුළුල් කිරීමට තිබෙන අවකාශය සීමිත වුවත්, ක්‍රියාවලිය මුළුල්ලේම සාමය ගොඩ නගන කාන්තාවන් සමඟ ක්‍රමානුකූලව අඛණ්ඩව හා නිසි පතා සම්බන්ධ වන්න.

කාන්තාවන් බැහැර කරන සාකච්ඡා ක්‍රියාවලියන් බොහෝ දුරට අසාර්ථක වීමට ඉඩතිබේ. එවැනි ක්‍රියාවලීන්වල මානුෂීය, ආරක්‍ෂක හා දේශපාලන පිරිවැය දෙස බලන විට කාන්තාවන් ඇතුළත් කරගැනීම දේශපාලන හා මූල්‍ය සහයෝගය ලබා ගැනීම සඳහා වූ සාමාන්‍ය

කොන්දේසියක් බව පෙනේ. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ කණ්ඩායම් එක් එක් රටවලට පැමිණෙන අවස්ථාවල සිවිල් සමාජ සංවිධාන හා සාමය ගොඩනගන කාන්තාවන් සමඟ රැස්වීම් සංවිධානය කර, ඔවුන්ගේ අදහස්වලට සවන්දිය යුතුය.

කාන්තාවන් ඇතුළත් කරගන්නා ලෙස ඉල්ලීම් කිරිම සඳහා බලපෑම් කිරීමේ ඔබගේ ශක්තිය පාවිච්චි කරන්න. ඇෆ්ගනිස්ථානය සඳහා වූ හිටපු නෝර්වේ තානාපති කැරේ ආස් මෙසේ සඳහන් කර ඇත. '' සාම සාකච්ඡා මේසයට සියලුම ඇෆ්ගන් පාර්ශ්වයන් නොර්වේ රට එක් කළ යුතු නම්. ඒ සඳහා වූ පූර්ව කොන්දේසියක් වන්නේ එම මේසයේ කාන්තාවන් සිටිය යුතු බවය. මෙම දේශපාලන සහයෝගය නිසා සාම දූත පිරිසට කාන්තාවන්ද ඇතුළත් කර ගන්නා ලදි.

## කොටුව 4. සිවිල් සමාජ නියෝජිතවරුන් තෝරා ගැනීම සඳහා යහපත් පරිචයන්

සාම ක්‍රියාවලීන්වල ඇතුළත් කරගැනීම සඳහා සිවිල් සමාජ සංවිධාන හා කාන්තා නියෝජිතවරියන් හඳුනා ගැනීමේ ප්‍රශ්නය, ඇතුළත් කරගැනීම සඳහා වූ ප්‍රධාන බාධකයක් ලෙස පවතින බව ජාත්‍යන්තර ක්‍රියාධරයන් බොහෝ විට පවසති. බාධක තුනේ පෙන්වා දුන් ආකාරයට . ඔවුන් කවරහුද ? ‘හා ’සාර්ථක නියෝජනය අප තහවුරු කර ගන්නේ කෙසේද? යන ප්‍රශ්නද අප එක් අයෙකුට ආරාධනය කරන්නේ නම් ඔවුන් සියළු දෙනාටම ආරාධනය කළ යුතු වේ. යන අදහස් හේතුවෙන් බොහෝ අවස්ථාවල සිවිල් සමාජ සංවිධාන (විශේෂයෙන් කාන්තා කණ්ඩායම් මෙම ක්‍රියාවලියෙන් බැහැර කර ඇත). මෙම කණ්ඩායම් ගැටුම අවසන් කිරීම සඳහා සක්‍රීයව, හා කැපවීමෙන් කටයුතු කර ඇත.

ප්‍රාදේශීය සිවිල් සමාජ කණ්ඩායම් ගෞතමාලාවේ හා උතුරු අයර්ලන්තයේ කළ ආකාරයට තමන්ගේ නියෝජිතවරුන් කැඳවා

ඔවුන් තෝරා ගැනීමේ අවස්ථාවද තිබේ. ප්‍රසිද්ධ සහභාගිත්වය හා තනතුරු සඳහා ප්‍රචාරණය කිරීමද කළ හැකිය. නමුත් අනෙකුත් අවස්ථාවල මෙවැනි දේවල් නොකළ හැකිය.

මෙම කොටුව “ සිවිල් සමාජ කණ්ඩායම් හඳුනා ගැනීම සඳහා වූ නියැදි නිර්ණායකය” කොටුව 3 හා සම්බන්ධ වේ. ගෝලීය වශයෙන් කටයුතු කරන සාම ක්‍රියාධරයන්ගේ අදහස් අනුව සහභාගිවන්නන් හා නියෝජිතවරුන් තෝරා ගැනීම සඳහා වූ යහපත් පරිචයන් මෙම කොටුව ඉදිරිපත් කරයි.

1. ඇතුළත් කරන අයගේ විශ්වසනීයත්වය සනාථ කර ගැනීම සඳහා ක්‍රියාධරයන් සිතියම් ගත කරන්න. ක්ෂේත්‍ර ඇගයීම් හා විශ්වාසවන්ත ප්‍රාදේශීය හා ජාත්‍යන්තර සබඳතා පාවිච්චි කරමින් මෙය කළ හැකිය.

2. ප්‍රාදේශීය ක්‍රියාධරයන් සමඟ සාකච්ඡා කර, තෝරා ගැනීමේ නිර්ණායකය පිළියෙල කරන්න. (බලන්න කොටුව 3). ඉහළ සිට පහළට කරන ප්‍රවේශය නිත්‍යානුකූල බවින් අඩුවිය හැකිය.

ඒවා නිශ්චිත හා ළඟා කර ගත හැකි නිර්ණායකයන් ලෙස ස්ථාපිත කර ගන්න. ප්‍රමුඛතාවයන් අතර ස්ත්‍රී-පුරුෂ සමාජභාව සංවේදීභාවයද තහවුරු කරන්න.

3. සාමය ගොඩනගන කාන්තාවන්ට ප්‍රවේශ වීම සඳහා සාම්ප්‍රදායික නොවන කණ්ඩායම් සමඟ සම්බන්ධ වෙන්න. විශේෂයෙන් ගෝලීය කාන්තා, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාලයන් සමඟ සම්බන්ධ විය හැකිය.

4. පහත සඳහන් දේවල්වලින් හානි සිදුවීම වළක්වා ගන්න. (අ) සැමවිටම එකම විශේෂ අමුත්තන්ට ආරාධනා කිරීම. (ආ) ඉංග්‍රීසි භාෂාව කතා කරන අයට පමණක් සීමා කිරීමත (ඇ) භූගෝලීය/ ජනවාර්ගික සමබරතාවය තහවුරු නොකිරීම (ඈ) තෝරා ගැනීම සඳහා වූ නිර්ණායකය පිළිබඳ සාකච්ඡා නොකිරීම හෝ පැහැදිළි නොකිරීම.

5. තනි පුද්ගලයන්ට නොව සංවිධානවලට ආරාධනය කරන්න - දැනට පවතින ගැටලුව පදනම් කරගෙන තමන්ගේ නියෝජිතවරුන් තෝරා ගන්නා

ලෙස/පත් කරගන්නා ලෙස ඔවුන්ට කියන්න.

6. හැකිනම් සමගාමීව ජාතික සමාලෝචන පවත්වන්න. එය හරහා නියෝජිතවරුන් හඳුනා ගත හැකිය.

7. කාලය කෙටි වුවත්, පුද්ගලයන්ට තොරතුරු ලබාදීම සඳහා සම්බන්ධීකරණ හා ප්‍රතිපෝෂණ ක්‍රම ස්ථාපිත කර ගන්න. සෑම රැස්වීමකටම සෑම කෙනෙකුටම ආරාධනය නොකරන ලද්දේ ඇයි පැහැදිළි කර දෙන්න.

8. ජාත්‍යන්තර රැස්වීම් සඳහා ප්‍රාදේශීය සිවිල් සමාජ කණ්ඩායම්වලට - එම කණ්ඩායම්වල විශේෂඥතා ක්ෂේත්‍රය පදනම් කරගෙන - ආරාධනා කරන්න (උදා. වශයෙන් මානුෂීය සමුළු සඳහා සහන සේවා සපයන සංවිධානවලට ආරාධනා කළ හැකිය.)

9. සිවිල් සමාජ සංවිධාන ස්ථාපිත කරගෙන ඇති පත්කර ගැනීමේ ක්‍රියාවලීන්ට ගරු කරන්න. ඔවුන්ගේ තීරණ අභිබවා නොයන්න.

## III. තාක්ෂණික සහාය ලබාදෙන්න

1. (උදා. වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ක්ෂණිකව ක්‍රියාත්මකවන කණ්ඩායම් වලට අයත්) තාක්ෂණික උපදේශකවරුන් හා සමථකරණ ක්‍රියාවලියේ යෙදෙන නායකයන්ට තමන්ගේ නිපුණත්ව ක්ෂේත්‍රය පිළිබඳ ස්ත්‍රී-පුරුෂ සමාජභාව දෘෂ්ටි කෝණයකින් අවබෝධයක් ඇති බව තහවුරු කරන්න. (අ) බඳවා ගැනීමේදී හා ඔවුන්ගේ රාජකාරියේ කොටසක් වශයෙන් එය නිර්ණායකයක් කරන්න. (ආ) විධිමත් පුහුණුවක් ලබා දෙන්න. (ඇ) ස්ත්‍රී-පුරුෂ සමාජභාවය/ඇතුළත් කරගැනීමේ උපදේශකවරුන් අතර හවුල්කාරත්වයක් බලාපොරොත්තු වන්න.

2. සාම සාකච්ඡාවේදී මතු විය හැකි සියළුම වැදගත් මාතෘකාවන් පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාව විශ්ලේෂණ පත්‍රිකාවන් පිළියෙල කරන ලෙස ඉල්ලා සිටින්න. මෙම පත්‍රිකා සංවර්ධනය කරන ආකාරය පිළිබඳ ගැටුමේ යෙදී සිටින පාර්ශවකරුවන් හා සාමය ගොඩනගන කාන්තාවන් සමඟ සාකච්ඡා කරන්න.

3. සාමය ගොඩනගන කාන්තාවන් සමග කටයුතු කිරීමේ පළපුරුද්දක් ඇති දූත පිරිස් පත් කරන්න. සියළුම ක්ෂේත්‍ර පිළිබඳව ස්ත්‍රී-පුරුෂ දෘෂ්ඨී කෝණය ඒකාබද්ධ කරන්න.

4. දූත මෙහෙවරේ යෙදෙන නියෝජිතවරයාට සෘජුවම වාර්තාකරන ජ්‍යෙෂ්ඨ ස්ත්‍රී-පුරුෂ සමාජභාව/ඇතුළත් කරගැනීමේ උපදේශකවරයෙක් පත් කරන්න. ඔහු/ඇය දේශපාලන කණ්ඩායමේ සාමාජිකයෙක් විය යුතු අතර, නියෝජිතවරයාට සෘජුව වාර්තා කළ යුතුයි.

5. සාම සාකච්ඡාවලට අපක්ෂපාත ස්ත්‍රී-පුරුෂ සමාජභාව හා ඇතුළත් කරගැනීමේ උපදේශකවරයෙක් පත් කර ගන්නා ලෙස නිර්දේශ කරන්න. සාකච්ඡාවේ යෙදී සිටින සියළුම පාර්ශ්වකරුවන්ට දැනුම් දීමේ වගකීම ඔහු / ඇය සතු විය යුතුය.

6. සාමය ගොඩනගන කාන්තාවන්ට තාක්ෂණික ගැටලු පිළිබඳ ධාරිතාව ගොඩනගන්න (උදා: පාලන ව්‍යුහයන්, එදිරිවාදිකම් නතර කිරීම), සමථකරණ හා සාකච්ඡා කිරීමේ කුසලතාවන්ද මෙයට ඇතුළත් විය යුතුය. ඔවුන් ක්‍රියාත්මක කරන අය ලෙස හා අධීක්ෂණ කරන අය ලෙස කටයුතු කිරීමට හැකිවන පරිදි මෙය අඛණ්ඩව පවත්වා ගෙන යන්න.

7. සාමය ගොඩනගන කාන්තාවන් එක කණ්ඩායමකට ගොනු විය යුතු බවට බල නොකරන්න. ඔවුන් අතර සන්ධාන ගොඩනැගීමට පහසුකම් සලසන්න. සහයෝගය ලබාදීම සඳහා UN Women සංවිධානය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සමඟ එක්වී වැඩ කරන්න.

## සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණු:

- සාම ක්‍රියාවලියේ විවිධ අංශවල එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාව 1325 න්‍යායපත්‍රය ක්‍රියාත්මක කරන ආකාරය අනුව සමථකරුවන් ඇගයීමට ලක් කළ යුතුය.

- සමථකරණ කණ්ඩායමේ සම්බන්ධීකරණ නිලධාරියෙක් ( මහජන සම්බන්ධතා පිළිබඳ විස්තර ඇතුළුව පත් කිරීම සලකා බලන්න.) එම සම්බන්ධීකරණ නිලධාරියාට සිවිල් සමාජ සංවිධාන හා සාමය ගොඩනගන කාන්තාවන්ට තොරතුරු ලබාදීමේ හා ඔවුන්ට ප්‍රතිචාර දැක්වීමේ වගකීම තිබිය යුතුයි. තවද, ඔවුන්ට සමථකරුවා හෝ නියෝජිතවරයා සෘජුව සම්බන්ධවීමටද පහසුකම් තිබිය යුතුයි.

ඒකාබද්ධ පිරිමි/කාන්තා සම සමර්ථකරුවන් හා ඇතුළත් කරගැනීමේ නායකත්වය පිළිබඳ ආදර්ශයන් සඳහා අමතන්න. කෙන්යා සමර්ථකරණ ක්‍රියාවලිය 2008, ග්‍රේසා මැචල් කොෆි අනන් විසින් මෙහෙයවන ලදි. මෙය වැදගත් පූර්වාදර්ශයක් ලබා දෙයි.

## IV. පොදු පහසුකම් හා මූල්‍ය ආධාර ලබා දෙන්න.

1. සක්‍රීයව සාමය ගොඩනැඟීමේ ක්‍රියාවලියේ යෙදීම සඳහා ප්‍රාදේශීය සංවිධානවලට නිසි කලට නම්‍යශීලී ආකාරයෙන් මූල්‍යාධාර ලබා දෙන්න. අවශ්‍ය නම්, කාන්තාවන්, සාමය හා ආරක්ෂාව පිළිබඳ ගැටලු ගැන අත්දැකීමක් තිබෙන විශ්වසනීය ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හරහා මුදල් ලබා දෙන්න.
2. සාමය ගොඩනගන කාන්තාවන්ගේ වීසා අයදුම්පත්, ප්‍රවාහන පහසුකම් හා ආරක්ෂාව වැනි දේවල් ඉක්මනින් හා සම්බන්ධීකරණයෙන් යුතුව සිදු කරන්න.

> ආරක්ෂාව පිළිබඳ ගැටලු හඳුනා ගැනීමට හා ආමන්ත්‍රණය කිරීමට පීඩාවට පත් සිවිල් සමාජ සංවිධානයක් සමඟ සාකච්ඡා කරන්න.

3. ජාත්‍යන්තර රැස්වීම් වලට සහභාගී වන සාමය ගොඩනගන කාන්තාවන් අදාළ අවසර පත්‍රයන් හා රැස්වීම් පවත්වන ස්ථානවලට පිවිසුම් පහසුකම් ලබා ගැනීම තහවුරු කරන්න.
4. සාමය ගොඩනගන කාන්තාවන්ට සාම ක්‍රියාවලියට යෑමට පමණක් නොව, නිවසේ රැඳී සිටින පවුලද රැක බලා ගැනීම සඳහාද දීමනාවක් ලබා දෙන්න.

5. සියළුම රැස්වීම්වල කතා පරිවර්තන පහසුකම් ලබා දෙන්න. තාක්ෂණික සුදානම් කිරීමේ ලිපි ලේඛණද ඇතුළු සියළුම ලිපි ලේඛණවල දේශීය භාෂාවල පරිවර්තනයන් ලබා දෙන්න.

6. සාමය ගොඩනගන කාන්තාවන්ගේ ජාලයන් තිරසාරව පවත්වා ගෙන යෑම සඳහා දීර්ඝ කාලීනව සම්පත් වෙන් කරන්න - විශේෂයෙන් ක්‍රියාත්මක කාල වකවානුවේදී එක් එක් ක්ෂේත්‍රවල ඔවුන්ගේ ගැඹුරු තාක්ෂණික දැනුම හා ප්‍රාදේශීය නිපුණත්වය ඉතා වැදගත් වේ.

## නිමාව:
## වෙනස් වන පරිචයන් හා රටාවන්

තුවක්කු නිශ්ශබ්ද වීම, බෝම්බ පිපිරීම නතර වීම හා යුද්ධය අවසන් කිරීමට එකඟ වීම යන දේවල් සිදු වූ පසු සැබෑ සාම සංස්කෘතියක් මුල් බැස ගැනීම ඉතා දුෂ්කර කාර්යයක් වේ. නමුත් බලය සඳහා තිබෙන මාර්ගය ප්‍රචණ්ඩත්වය පමණක් යැයි සිතන සුළුතරයගේ අතට මෙය පත් කරන්නේ නම්, යුද්ධයන් හා එම යුද්ධයන් සඳහා වූ මූලික හේතු දිගටම පවත්වනු ඇත. යුද්ධය අවසන් කිරීමට සැමවිටම දැඩි ලෙස ක්‍රියාකරන, හඬ නඟන සුළුතරය අවශ්‍ය වන අතර, බොහෝ අවස්ථාවල නිශ්ශබ්දව හා සාමකාමීව සිටින නමුත් සමාන ආකාරයෙන් සක්‍රීය බහුතරයක් වන ප්‍රජාවද අපට අමතක කළ නොහැකිය.

සිරියාව, ඇෆ්ගනිස්ථානය, සූඩාන් හෝ බුරුමය වැනි රටවල් වල සිදුවන ඉතාම දරුණු සංකීර්ණ ගැටුම් මධ්‍යයේ වුවද ජනතාවගෙන් බහුතරයක් තමන්ගේ පවුල් ජීවිතයේ සාමය හා සාමාන්‍ය තත්ත්වය දිගටම පවත්වා ගෙන යති. සෑම පසුබිමක සිවිල් ජනතාවගෙන් සුළු කොටසකට තමන්ගේ ප්‍රජාව වෙනුවෙන් හා තමන්ගේ රට වෙනුවෙන් සාමය සඳහා නැගී

සිටීමටත්, වැඩ කිරීටත් ධෛර්යය ලැබී ඇත. ඔවුන් තමන්ගේ අගයන් හා විශ්වාසයන්ගෙන් සන්නද්ධව මෙයට සම්බන්ධ වෙති. ඔවුන්ගේ අදහස් හා හඬවල් වෙනස් විය හැකිය. නමුත් ඔවුන්ගේ ධෛර්යය හා ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා වූ ඔවුන්ගේ කැපවීම හා සමාජයන් සඳහා වූ ඔවුන්ගේ දැක්ම සමාජ සාධාරණත්වය හා සමානාත්මතාවය යන අගයන්වල මුල් බැසගෙන තිබේ. ඔවුන් ඉතා වැදගත් ක්‍රියාධරයන් වේ. එම නිසා ජාත්‍යන්තර ප්‍රජාව ඔවුන් පිළිගැනීමට ලක්කර, අනාගතයේදී සාම සාකච්ඡාවලට සහභාගී වීමේ අයිතිය ඔවුන් වෙත ලබා දිය යුතුය.

මෙය සඳහා සාම සාකච්ඡා ආරක්‍ෂාව හා දේශපාලන ක්‍රියාවලීන්ට පමණක් සීමා වූ සාකච්ඡා යන පටු මතවාදයෙන් ඔබ්බට ගොස්, එහි විශාල පරිවර්තනයක් සිදුවිය යුතුය. එය හරහා සාම සාකච්ඡා සමාජමය ක්‍රියාවලියන් ලෙසද පිළිගත යුතු වේ. සාම සාකච්ඡා පවත්වන මේසය බෙදීම හා බලය බෙදා ගැනීම සඳහා වූ ස්ථානයක් වීම වෙනුවට, යුද්ධයෙන් පීඩාවට පත්වී සිටින සමාජය නැවත ගොඩනැගීම සඳහා වගකීම් බෙදා ගන්නා ස්ථානයක් විය යුතුය. වත්මන් යුගයේ යුද්ධවලදී සාම ක්‍රියාවලීන්

පමණක් තිරසාර සාමය ඇති කළ හැකි යැයි සිතීම පරමාදර්ශයක් පමණක් වේ. සාමය ගොඩනගන සිවිල් සමාජයේ සාමාජිකයන් - පිරිමින් හා කාන්තාවන් ඇතුළත් කර ගැනීම සමකාලීන ගැටුම් වැළැක්වීමටත්, විසඳා ගැනීමටත්, පරිවර්තනය කිරීමටත් වැඩි වශයෙන් වැදගත් වේ. මෙම වඩා හොඳ සාම මෙවලම ඇතුළත් කර ගැනීම සාර්ථක කර ගැනීම සඳහා ප්‍රායෝගික මඟ පෙන්වීම හා සක්‍රීය පියවරයන් ඉදිරිපත් කරයි.

## ඇමුණුම I
## කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාව

| යෝජනාව/ වසර | අවධානය යොමු කරන ක්ෂේත්‍ර |
|---|---|
| 1325/2000 | ගැටුම් පිළිබඳ කාන්තාවන්ගේ අත්දැකීම් හා සාමය සහ ආරක්ෂාව පවත්වා ගෙන යෑම අතර සම්බන්ධයක් තිබෙන බව මෙම යෝජනාව පිළිගනීත ගැටුම් විසඳීමටත්, සාමය ගොඩනැගීමටත් කාන්තාවන්ගේ නායකත්වය හා සමාන සහභාගිත්වය අවශ්‍ය බව එය සඳහන් කරයි. සාම ක්‍රියාකාරකම් සඳහා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ප්‍රධාන ප්‍රවාහයට රැගෙන යා යුතු බවද සඳහන් කරයි. |
| 1820/2008 | යුද්ධයේ උපක්‍රමයක් වශයෙන් ලිංගික ප්‍රචණ්ඩත්වය යෙදීම පිළිගත් පළවෙනි යෝජනාවත ගැටුම් වැළැක්වීම හා විසඳීම |

පිළිබඳ තීරණ ගැනීමේදී කාන්තාවන්ගේ කාර්යභාරයන් වැඩි කිරීමේ අවශ්‍යතාවය එය අවධාරණය කරයි.

1888/2009 මෙය 1820 ක්‍රියාත්මක කිරීම සඳහා වූ මෙවලම් ශක්තිමත් කරන අතර, ගැටුම්වල සිදුවන ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශේෂ නියෝජිතවරයෙක් පත් කරන ලෙස මහලේකම්වරයා ගෙන් ඉල්ලා සිටි. කාන්තා සමථකරුවන් ප්‍රමාණවත් ලෙස නොමැති වීම ගැනද කණස්සල්ල පළ කරයි.

1889/2009 සාම ක්‍රියාවලීන්වල කාන්තාවන්ගේ සහභාගිත්වය හා පශ්චාත් ගැටුම් කාල වකවානුවල කාන්තාවන්ගේ සහභාගිත්වය තවදුරටත් ශක්තිමත් කළ යුතු බව ඉල්ලා සිටී. දර්ශකයන් සංවර්ධනය කිරීම, අධීක්ෂණය කිරීම, 1325 යෝජනාවේ ප්‍රගතිය වාර්තා කිරීම වැනි දේවල්වල

ද කාන්තාවන්ගේ සහභාගිත්වය වැඩිකළ යුතු බවද සඳහන් කරයි.

| | |
|---|---|
| 1960/2010 | ගැටුම්වල සිදුවන ලිංගික ප්‍රචණ්ඩත්වය සඳහා වගවීමේ ක්‍රමවේදයක් ඉදිරිපත් කරයි. විධිමත් සාම ක්‍රියාවලීන්වල කාන්තාවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සඳහා වූ ප්‍රයත්නයන් දිරි ගන්වයි. |
| 2106/2013 | ලිංගික ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීම සඳහා ක්‍රියාත්මක මඟ පෙන්වීම් ලබාදෙන අතර, කාන්තා ආරක්ෂක උපදේශකවරුන් වැඩි වශයෙන් සේවයේ යෙදිය යුතු බවද ඉල්ලා සිටී. |
| 2122/2013 | තීරණ ගැනීමේදී කාන්තාවන්ගේ සමාන හා සම්පූර්ණ සහභාගිත්වය ඇති කිරීම සඳහා සාම සාකච්ඡාවල පහසුකම් සැලසිය යුතු බව සියළුම පාර්ශ්ව කරුවන්ගෙන් ඉල්ලා සිටීත ගැටුම් කලාපවල කාන්තාවන්ට ලැබෙන සම්පත් වැඩි කිරීම මගින් |

සාමය ඇති කිරීමේ ක්‍රියාවලියේදී කාන්තාවන්ගේ සහභාගිත්වය වැඩි කිරීමේ අරමුණෙන් කටයුතු කරයි. කාන්තා සිවිල් සමාජ සංවිධානවල වැදගත් දායකත්වයන් පිළිගැනීමට ලක් කරයි.

**2242/2015** 15 වන සංවත්සරය සනිටුවන් කරන අතර, 1325 යෝජනාව සඳහා වූ කැපවීම නැවතත් තහවුරු කරයි. ප්‍රචණ්ඩකාරී අන්තවාදයට මුහුණදීමේදී කාන්තාවන්ගේ කාර්යභාරය පෙන්වා දෙන අතර, ත්‍රස්ථවාදය කාන්තාවන්ගේ හා ගැහැණු ළමුන්ගේ මානව අයිතිවාසිකම් කෙරෙහි ඇතිකරන විවිධ බලපෑම් ආමන්ත්‍රණය කරයි.